# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,039 - 2017 සැප්තැම්බර් මස 29 වැනි සිකුරාදා - 2017.09.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### තනතුරු ඇබෑර්තු

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය

**විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම**

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශයේ නීති නිලධාරී තනතුරේ පවතින එක් පුරප්පාඩුවක් පිරවීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලකුණු දීමේ පරිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණු එකතුවේ කුසලතාවය මත පුරප්පාඩුව සඳහා බඳවා ගැනේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

02. අවශ්‍ය සුදුසුකම් :

2.1 අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් :

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම;

හෝ

(ii) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

2.2 පළපුරුද්ද :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් අනතුරුව නීතිඥයෙකු වශයෙන් වසර 03කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛණ වල පළපුරුද්ද ලබා ගත් කාලය, දිනය, හා නිළ මුද්‍රාව පැහැදිලිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.)

2.3 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

2.4 වෙනත් සුදුසුකම් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
(ii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.
(iii) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය.
(ii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය.
(iii) තනතුරට බඳවාගෙන වසර 03ක් ගත වීමට පෙර බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් ආකාරයට පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.
(iv) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම පත්වීම භාරගත් දින සිට වසර 05ක් ඉකුත් වීමට පෙර අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත් බව ඔබ විසින් සනාථ කළ යුතු අතර රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.
(v) මෙම පත්වීම රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලටද යටත් වේ.

04. *වයස් සීමාව* :

ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

05. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන චක්‍රලේඛයට අනුව SL-1-2016, රු.47,615 - 10 x 1335 - 8 x 1630 - 17 x 2170 - රු. 110,895/- ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. (ඔබට වැටුප් ගෙවනු ලබන්නේ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01. | *අතිරේක අධ්‍යාපන සුදුසුකම්* | | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | 20 |
| | - පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 20 | |
| | - දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 15 | |
| | - දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |
| | සටහන : ගෞරව සාමාර්ථයක් සමඟ අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 10 ලබා දිය යුතුය.<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ- උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්) | | |
| 02 | *අතිරේක වෘත්තීය සුදුසුකම්* | | *15* |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාල ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්) | | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්) | | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාල ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්) | | |
| 03 | *අතිරේක පළපුරුද්ද* | | |
| | නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද<br>- මාස 06 ට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02<br>එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30 ක්<br>(මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයෙකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර)<br>(අවුරුදු 20 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතීඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය) | | 30 |
| 04 | *තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම* | | 15 |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම සඳහා | | |
| | රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා | 10 | |
| | රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| | - මාස 06/පැය 720 | 07 | |
| | - මාස 03/පැය 360 | 05 | |
| 05 | *ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය* | | 15 |
| | ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/ උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/ නීතිවේදී උපාධිය (අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය.) | 15 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01ක් හෝ පැය 1500) | 10 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| | - මාස 06/පැය 720 | 07 | |
| | - මාස 03/පැය 360 | 05 | |
| 06 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | | 05 |
| | **මුළු එකතුව** | | **100** |

07. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :

7.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි.

7.2 සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

7.3 සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයන් විසින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍රවලින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු රියදුරු බලපත්‍රය.

08. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :

8.1 අයදුම්පත් 2017.10.30 වැනි දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය,
දෙවන මහල,
කම්කරු මහ ලේකම් කාර්යාලය,
නාරාහේන්පිට,
කොළඹ 05.


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 ඔක්තෝබර් මස 20 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2017 ඔක්තෝබර් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

8.2 ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 11 දක්වාත්, 02 වන පිටුව අංක 12 සිට 16 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "නීති නිලධාරී තනතුර සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය.

8.3 මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

8.4 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතීඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු /පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් හෝ රු. 37,522/- ක් හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

8.5 දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

09. සාවද්‍ය තොරතුරු සැපයීම :

අපේක්ෂකයෙකු තම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් පිළිබඳව බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ නීති ක්‍රියාමාර්ගයන්ට යටත්ව රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එස්. ඒ. නිමල් සරණතිස්ස,
ලේකම්.

කම්කරු,වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන
අමාත්‍යාංශය,
කම්කරු මහ ලේකම් කාර්යාලය,
නාරාහේන්පිට,
කොළඹ 05.

**කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය**

නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම්පත

| අනු අංකය | |
|---|---|

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

01. (i) සම්පූර්ණ නම : Mr./Mrs./Miss :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(ii) මුලකුරු සමඟ නම :———.
(iii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :———.
(සිංහලෙන්/දෙමළෙන්)

02. ස්ථිර පදිංචි ලිපිනය :———.

03. තාවකාලික ලිපිනය :——————.

04. ස්ත්‍රී / පුරුෂ භාවය :
පුරුෂ - 0 / ස්ත්‍රී - 1 [ ]
(ඉදිරි කොටුවෙහි අදාළ අංකය යොදන්න.)

05. විවාහක / අවිවාහක බව :

| විවාහක | | අවිවාහක | |
|---|---|---|---|

(අදාළ කොටුව තුළින් ✓ ලකුණ යොදන්න.)

06. පුරවැසිභාවය :——————.

07. පුරවැසිභාවය උපතින් ද / ලියාපදිංචියෙන් ද යන වග :——————.

08. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

09. දුරකථන අංකය : ස්ථාවර

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

ජංගම

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

10. (i) උපන් දිනය :

| වර්ෂය | | | | | මාසය | | | දිනය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|

(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

| අවුරුදු | | | මාස | | | දින | | |
|---|---|---|---|---|---|---|---|---|

11. සුදුසුකම් :
11.1 අධ්‍යාපන සුදුසුකම් :
(i) උපාධිය බලපැවැත්වෙන දිනය :——————.
(ii) විශ්වවිද්‍යාලය / ආයතනය :——————.
(iii) උපාධිය :——————.

12. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :
(i) ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයෙකු වශයෙන් ලබා ඇති පළපුරුද්ද :——————.
(ii) :——————.
(iii) :——————.
(iv) :——————.

13. ඔබ යම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී චෝදනා ලබා තිබේද? ඔව් / නැත
13. (i) එසේ නම් දිනය හා නඩු අංකය සමඟ සම්පූර්ණ විස්තර සපයන්න. :——————.

14. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පත්‍රයෙහි, මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා වන බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මාගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වන බවත්, තෝරා ගැනීමෙන් පසු එම වරද දැනගතහොත් කිසිදු වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බව දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................................................. මහතා / මහත්මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු / ඇය මා ඉදිරිපිට දී ..................................................... දින ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

දිනය :———.

——————,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන).

16. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය හා නිර්දේශය : (දැනටමත් රාජ්‍ය සේවයේ නියැලෙන නිලධාරීන් විසින් සම්පූර්ණ කළ යුතුයි.)

.............................................................. මහතා /මහත්මිය /මෙනවිය මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ .............................................................. ලෙස සේවයේ නියුතු බවත්, ඔහුගේ / ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, ඔහු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු / ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කිරීමට එකඟ වෙමි.

දිනය :———.——————,

(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන).
සම්පූර්ණ නම :———.

තනතුර :———.
ලිපිනය :———.
(නිල මුද්‍රාවෙන් සනාථ කළ යුතුය.)

05-761

**මුදල් කොමිෂන් සභාව**

මුදල් කොමිෂන් සභාවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ III ශ්‍රේණියේ රියදුරු තනතුරු 4ක් සඳහා පහත සුදුසුකම් ඇති ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

උක්ත කරුණ සම්බන්ධව අංක 2037 දරන 2017.09.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* හා බැඳේ.

02 මෙයට අදාලව දෙමළ මාධ්‍ය අයදුම්පත්‍රය රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ www. documents. gov. lk නමැති වෙබ් අඩවියෙන් බාගත කර ගැනීමට කටයුතු කරන්න.

03. අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය 2017 ඔක්තෝබර් මස 06 දින දක්වා දීර්ඝ කරන ලදී.

04. එම බඳවා ගැනීමේ නිවේදනයේ සෙසු කරුණු නොවෙනස්ව පවතී.

ඒ. ටී. එම්. යූ. ඩී. බී. තෙන්නකෝන්,
ලේකම්,
මුදල් කොමිෂන් සභාව.

2017 සැප්තැම්බර් මස 21 වැනි දින.

09-892

---

**ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය**

විධායක සේවා ගණයේ නීති නිලධාරී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීම

**විධායක සේවා ගණයේ නීති නිලධාරී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම**

*තනතුරට පැවරෙන කාර්යභාරය.*-අමාත්‍යාංශයට හා එහි විෂය පථයට අයත් රාජ්‍ය ආයතනවල පනත් කෙටුම්පත්, රෙගුලාසි හා ගිවිසුම් වැනි නීතිමය ලියවිලි සකස් කිරීම, නීතිපති දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය, මානව හිමිකම් පැමිණිලි සම්බන්ධව ක්‍රියාකිරීම හා අමාත්‍යාංශ නිලධාරීන් රාජකාරී විෂය පථයට අදළ කරුණක් මත වග උත්තරකරුවන් වන නඩු සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම හා නඩු සඳහා සහභාගිවීම වැනි කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

*තනතුරෙහි ස්වභාවය.*- මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත වසරක කාලයක් සඳහා බඳවාගනු ලබන තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි.

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව 01 කි. පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. අවශ්‍ය වුවහොත් ඉහත ඇබෑර්තු සංඛ්‍යාව නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

01. *අවශ්‍ය සුදුසුකම්* :

(i) අධ්‍යාපන සුදුසුකම් : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාල-යකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) පළපුරුද්ද : ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසුව වසර 03කට නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(iii) කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(iv) වෙනත් :
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත්කැඳවීමේ/ නිවේදනයේ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

02. *වයස් සීමාව.*- ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.

03. මාසික දීමනාව :

බඳවාගනු ලබන දින සිට 2017.12.31 දින දක්වා කාලය සඳහා මාසිකව රු. 32,807 ක මාසික දීමනාවක් සහ රු. 4,715 මාසික ගැලපුම් දීමනාවක් සමඟ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

2018.01.01 වැනි දින සිට 2018.12.31 වැනි දින දක්වා කාලය සඳහා මාසිකව රු. 37,743 ක මාසික දීමනාවක් සමඟ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

04.
(i) *බඳවාගැනීමේ ක්‍රමය* : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මඟින් උපරිම සුදුසුකම්ලත් තැනැත්තන් බඳවාගනු ලැබේ.

(ii) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *එකතුව* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදළ නොවේ |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 15 | |
| අතිරේක පළපුරුද්ද | 30 | |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතාවය | 15 | |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | 05 | |
| එකතුව | **100** | |

05. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :**

නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති හා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවා මෙම නිවේදනය අනුව වන සුදුසුකම් තිබේ දැයි පරීක්ෂා කරන අවස්ථාවේ මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම්වලට අදළ සහතික පත්වල මුල්පිටපත් ඉදිරිපත් කළයුතු අතර අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

5.1 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු රියදුරු බලපත්‍රය.

06. **අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය**

අයදුම්පත් 2017.10.16 වැනි දිනට පෙර හෝ ඊට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.

අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''**නීති නිලධාරී තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවීම**'' යන්න සඳහන් කරන්න.

(i) නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍රය සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේදී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට පිළිවන.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ලේකම්,
ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය.

2017 සැප්තැම්බර් මස 11 වැනි දින,
ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1090,
ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.

**ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය**

විධායක සේවා ගණයේ නීති නිලධාරි තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

**ආදර්ශ අයදුම්පත්‍රය**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

1. මුලකුරු සමඟ නම :———.
2. සම්පූර්ණ නම :———.
3. ජාතික හැඳුනුම්පත් අංකය :
4. ස්ථිර ලිපිනය :———.
5. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 පුරුෂ - 0
6. උපන් දිනය : වර්ෂය මාසය දිනය
7. දුරකථන අංකය 1. 2. 3.
8. අධ්‍යාපන සුදුසුකම් :
උපාධිය ලබාගත් විශ්වවිද්‍යාලය :———.
වර්ෂය :———.
විෂයයන් :..................................
..................................
..................................
..................................
..................................
9. i. වෘත්තීය සුදුසුකම් :———.
ii. වෙනත් සුදුසුකම්
1. ———.
2. ———.
3. ———.
10. තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද :———.
11. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
(අදාළ කොටුවේ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න) ඔව් නැත
12. අයදුම්කරුගේ සහතිකය :
*(අ)* මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ /හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.
*(ආ)* මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.
*(ඇ)* මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

09-826

---

**සෞඛ්‍ය/පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි - බණ්ඩ 1 සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීම - විවෘත

ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ඇති බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය සඳහා අනුමත කාර්ය මණ්ඩල ලැයිස්තුවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/03-01-13-2015 හා 2017.03.07 වැනි දිනැති ලිපිය මගින් අනුමත ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි - බණ්ඩ 1 සේවා ගණයේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය අනුව බඳවා ගැනීමට 2017.10.29 වැනි දිනට පහත සුදුසුකම් සම්පූර්ණ කරන අය අතරින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| පර්යේෂණ නිලධාරි (උද්භිද) | 01 |
| පර්යේෂණ නිලධාරි (ජෛව තාක්ෂණ) | 01 |
| පර්යේෂණ නිලධාරි (කෘෂි) | 01 |
| පර්යේෂණ නිලධාරි (ශාක විද්‍යාව) | 01 |
| පර්යේෂණ නිලධාරි (වනස්පති) | 01 |
| පර්යේෂණ නිලධාරි (ඖෂධ වේදී) | 01 |
| පර්යේෂණ නිලධාරි (වෛද්‍ය රසායන) | 01 |
| පර්යේෂණ නිලධාරි (ජෛව රසායන) | 01 |
| පර්යේෂණ නිලධාරි (ආහාර විද්‍යා) | 01 |
| පර්යේෂණ නිලධාරි (තත්ත්ව පාලන) | 01 |
| පර්යේෂණ නිලධාරි (මානව ජීව විද්‍යා) | 01 |
| පර්යේෂණ නිලධාරි (විශ්ලේෂණ) | 01 |
| පර්යේෂණ නිලධාරි (රසායන විද්‍යා) | 01 |
| පර්යේෂණ නිලධාරි (අනුක ජීව විද්‍යා) | 01 |
| පර්යේෂණ නිලධාරි (විෂ විද්‍යා) | 01 |
| පර්යේෂණ නිලධාරි (වෛද්‍ය ක්ෂුද්‍ර ජීව විද්‍යා) | 01 |
| පර්යේෂණ නිලධාරි (ජීව භෞත විද්‍යා) | 01 |
| පර්යේෂණ නිලධාරි (සමාජ විද්‍යා) | 01 |

ඉහත බඳවා ගැනීම්වලදී සීමිත ධාරාවෙන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදී පමණක් විවෘත ධාරාවෙන් බඳවා ගනු ලැබේ.

1. වැටුප :
   1.1 **වැටුප් කේත අංකය** - MN6-3/2016
   1.2 **වැටුප් පරිමාණය** - රු. 36,585-10x660-11x755-15x930- රු. 65,440

2. **බඳවා ගන්නා ශ්‍රේණිය** - II ශ්‍රේණිය :

3. **අධ්‍යාපන සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේදී (විශේෂ) උපාධිය ප්‍රථම පෙළ සාමාර්ථයක් හෝ දෙවන පෙළ (ඉහළ පන්තිය) සාමාර්ථයක් හෝ දෙවන පෙළ (පහළ පන්තිය) සාමාර්ථයක් සහිතව සමත්වී තිබීම හා අදාළ විෂය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබාගෙන තිබීම.

| *තනතුරු නාමය* | *සුදුසුකම්* |
|---|---|
| පර්යේෂණ නිලධාරි (උද්භිද) | *උපාධියට අදාළ විෂයයන්-* උද්භිද විද්‍යාව/වන විද්‍යාව/පාරිසරික විද්‍යාව. *පශ්චාත් උපාධියට අදළ විෂයයන්-* උද්භිද විද්‍යාව/වන විද්‍යාව/පාරිසරික විද්‍යාව/ඖෂධ පැලෑටි භාවිතා කිරීම පිළිබඳ පශ්චාත් උපාධියක් හදරා තිබීම. |
| පර්යේෂණ නිලධාරි (ජෛව තාක්ෂණ) | උපාධියට අදාළ විෂයයන් — ජෛව රසායන/අනුක ජීව විද්‍යාව/සෛල ජීව විද්‍යාව පශ්චාත් උපාධියට අදළ විෂයයන් ජෛව රසායන හා අනුක ජීව විද්‍යාව/ සෛල ජීව විද්‍යාව /ජෛව තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් හදරා තිබීම. |
| පර්යේෂණ නිලධාරි (කෘෂි) | උපාධියට අදාළ විෂයයන් — කෘෂිකර්මය/කෘෂි විද්‍යාව පශ්චාත් උපාධියට අදළ විෂයයන් — කෘෂිකර්මය/කෘෂි විද්‍යාව/කෘෂි ජීව විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හදරා තිබීම. |
| පර්යේෂණ නිලධාරි (ශාක විද්‍යාව) | උපාධියට අදාළ විෂයයන් — උද්භිද විද්‍යාව/ශාක විද්‍යාව පශ්චාත් උපාධියට අදළ විෂයයන් — උද්භිද විද්‍යාව/ශාක විද්‍යාව/ශාක කායික විද්‍යාව/ඖෂධ පැලෑටි භාවිතා කිරීම පිළිබඳ පශ්චාත් උපාධියක් හදරා තිබීම. |
| පර්යේෂණ නිලධාරි (වනස්පති) | උපාධියට අදාළ විෂයයන් — රසායන විද්‍යාව/ජෛව රසායන විද්‍යාව/විශ්ලේෂණ රසායන විද්‍යාව පශ්චාත් උපාධියට අදළ විෂයන් — රසායන විද්‍යාව/ජෛව රසායන විද්‍යාව/විශ්ලේෂණ රසායන විද්‍යාව/ ඖෂධ පැලෑටි භාවිතා කිරීම පිළිබඳ පශ්චාත් උපාධියක් හදරා තිබීම. |
| පර්යේෂණ නිලධාරි (ඖෂධවේදී) | උපාධියට අදාළ විෂයයන් — ඖෂධවේදී පශ්චාත් උපාධියට අදළ විෂයයන් — රසායන විද්‍යාව/ජෛව රසායන විද්‍යාව/විශ්ලේෂණ රසායන විද්‍යාව/වෛද්‍ය රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හදරා තිබීම. |
| පර්යේෂණ නිලධාරි (වෛද්‍ය රසායන) | උපාධියට අදාළ විෂයයන් — රසායන විද්‍යාව/විශ්ලේෂණ රසායන විද්‍යාව/වෛද්‍ය රසායන විද්‍යාව පශ්චාත් උපාධියට අදළ විෂයයන් — රසායන විද්‍යාව/විශ්ලේෂණ රසායන විද්‍යාව/වෛද්‍ය රසායන විද්‍යාව සමඟ ඖෂධ පැලෑටි භාවිතා කිරීම පිළිබඳ පශ්චාත් උපාධියක් හදරා තිබීම. |
| පර්යේෂණ නිලධාරි (ජෛව රසායන) | උපාධියට අදාළ විෂයයන් — රසායන විද්‍යාව/ජෛව රසායන විද්‍යාව පශ්චාත් උපාධියට අදළ විෂයයන් — රසායන විද්‍යාව/ජෛව රසායන විද්‍යාව/විශ්ලේෂණ රසායන විද්‍යාව/ශාක විද්‍යාව/වෛද්‍ය රසායන විද්‍යාව/ව්‍යවහාරික කාබනික රසායන පිළිබඳ පශ්චාත් උපාධියක් හදරා තිබීම. |
| පර්යේෂණ නිලධාරි (රසායන විද්‍යාව) | උපාධියට අදාළ විෂයයන් — රසායන විද්‍යාව/ජෛව රසායන විද්‍යාව /විශ්ලේෂණ රසායන විද්‍යාව පශ්චාත් උපාධියට අදල විෂයයන් - ජෛව රසායන විද්‍යාව/ව්‍යවහාරික කාබනික රසායන පිළිබඳ පශ්චාත් උපාධියක් හදාරා තිබීම. |
| පර්යේෂණ නිලධාරි (ආහාර විද්‍යා) | උපාධියට අදල විෂයයන් — ආහාර විද්‍යාව හා තාක්ෂණය/ආහාර විද්‍යාව හා පෝෂණය පශ්චාත් උපාධියට අදල විෂයයන් - ආහාර විද්‍යාව හා තාක්ෂණය/ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් හදරා තිබීම. |
| පර්යේෂණ නිලධාරි (තත්ව පාලන) | උපාධියට අදාළ විෂයයන් — රසායන විද්‍යාව /පාරිසරික විද්‍යාව පශ්චාත් උපාධියට අදළ විෂයයන් — තත්ව පාලන පිළිබඳ පශ්චාත් උපාධියක් හදරා තිබීම. |
| පර්යේෂණ නිලධාරි (මානව ජීව විද්‍යා) | උපාධියට අදාළ විෂයයන් — මානව ජීව විද්‍යා පශ්චාත් උපාධියට අදළ විෂයයන් — මානව ජීව විද්‍යා/කායික විද්‍යා/ජෛව විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හදරා තිබීම. |
| පර්යේෂණ නිලධාරි (විශ්ලේෂණ) | උපාධියට අදාළ විෂයයන් — රසායන විද්‍යාව/විශ්ලේෂණ රසායන, ජෛව රසායන විද්‍යාව/වෛද්‍ය රසායන විද්‍යාව පශ්චාත් උපාධියට අදළ විෂයයන් — විශ්ලේෂණ රසායන/වෛද්‍ය රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හදරා තිබීම. |
| පර්යේෂණ නිලධාරි (අනුක ජීව විද්‍යා) | උපාධියට අදාළ විෂයයන් — ජීව රසායන විද්‍යාව සහ අනුක ජීව විද්‍යව පශ්චාත් උපාධියට අදාළ විෂයයන් " අනුක ජීව විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හදරා තිබීම. |
| පර්යේෂණ නිලධාරි (විෂ විද්‍යා) | උපාධියට අදාළ විෂයයන් — රසායන විද්‍යාව/විශ්ලේෂණ රසායන විද්‍යාව/ජෛව රසායන විද්‍යාව පශ්චාත් උපාධියට අදාළ විෂයයන් — විෂ විද්‍යව පිළිබඳ පශ්චාත් උපාධියක් හදරා තිබීම. |
| පර්යේෂණ නිලධාරි (වෛද්‍ය ක්ෂුද්‍ර ජීව විද්‍යා) | උපාධියට අදාළ විෂයයන් — ක්ෂුද්‍ර ජීව විද්‍යාව පශ්චාත් උපාධියට අදාළ විෂයයන්- වෛද්‍ය ක්ෂුද්‍ර ජීව විද්‍යා පිළිබඳ පශ්චාත් උපාධියක් හදරා තිබීම. |
| පර්යේෂණ නිලධාරි (සමාජ විද්‍යා) | උපාධියට අදාළ විෂයයන් — සමාජ විද්‍යාව පශ්චාත් උපාධියට අදාළ විෂයයන් — මානව සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හදරා තිබීම. |
| පර්යේෂණ නිලධාරි (ජීව භෞත විද්‍යා) | උපාධියට අදාළ විෂයයන් — භෞතික විද්‍යාව/ජීව භෞතික විද්‍යාව පශ්චාත් උපාධියට අදාළ විෂයයන් — භෞතික විද්‍යාව/ජීව භෞතික විද්‍යාව/වෛද්‍ය භෞතික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හදරා තිබීම. |

4. වෘත්තිය සුදුසුකම් :
   අදළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද තිබෙන නිලධාරින් සඳහා විශේෂ අවධානය යොමු කරනු ලැබේ.
5. පළපුරුද්ද : අදළ ක්ෂේත්‍රයේ වෘත්තීය පළපුරුද්ද තිබිය යුතුය.
6. කායික සුදුසුකම් :
   සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
7. වෙනත් :
   (i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
   (ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
   (iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/
   ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8. වයස :

8.1 අවම සීමාව - අවුරුදු 21ට නොඅඩු

8.2 උපරිම සීමාව - අවුරුදු 35ට නොවැඩි

9. බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත විභාගයේ හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ මුළු ලකුණු මත තෝරා ගැනීම.

9.1 ලිඛිත විභාගය :

| *විෂය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතාව | 100 | 40% |
| වෘත්තියට අදළ විෂය දනුම | 100 | 40% |

9.2 පවත්වන බලධරයා - විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ ආයුර්වේද කොමසාරිස් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීම සඳහා සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අමතර අධ්‍යාපන සුදුසුකම් | 25 | අදළ නොවේ. |
| වෘත්තීය සුදුසුකම් | 20 | |
| වෘත්තීය පළපුරුද්ද | 20 | |
| පරිගණක හැකියාව | 15 | |
| භාෂා ප්‍රවීණතාවය | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී | | |
| දක්වන ලද කුසලතාවය | 05 | |
| | 100 | |

*සටහන* :

1. ඉහත වගුවෙහි දක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන්කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටියක් අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් කරනු ඇත.

2. ලිඛිත විභාගයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවා ලිඛිත විභාගයේ සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත තනතුරට බඳවා ගනු ලැබේ.

10. *අයදුම්පත් කැඳවීමේ ක්‍රමය* - රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම හා වෙබ් අඩවියේ පළ කිරීම මගින්.

ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන් පහත දක්වෙන ආකෘතිය අනුව සකස් කල අයදුම්පත් 2017.10.29 දිනට ප්‍රථම ආයුර්වේද කොමසාරිස් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි - ඛණ්ඩ 1 සේවා ගණය" තනතුර යනුවෙන් සඳහන් කළ යුතුය. අසත්‍ය හෝ අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන බවද වැඩිදුරටත් දන්වමි. (වැඩි විස්තර www.ayurveda.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැක.)

එම්.ඩී.එම්.ඩී. කරුණාතිලක,
ආයුර්වේද කොමසාරිස්.

2017 සැප්තැම්බර් මස 29 වැනි දින.
ආයුර්වේද දෙපාර්තමේන්තුව,
නාවින්න,
මහරගම.

### ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි - ඛණ්ඩ 1 සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීම - විවෘත

1. මුලකුරු සමග නම :———.
2. සම්පූර්ණ නම :———.
3. (I) ස්ථිර ලිපිනය :———.
   (II) දුරකථන අංකය :———.
4. ජාතික හැඳුනුම්පත් අංකය :———.
5. උපන් දිනය :———.
6. අධ්‍යාපන සුදුසුකම් :

| *උපාධිය* | *විශ්වවිද්‍යාලය* | *උපාධිය සම්පූර්ණ කළ දිනය* | *හදරන ලද විෂයයන්* |
|---|---|---|---|
| | | | 1.<br>2.<br>3. |

7. වෘත්තීය සුදුසුකම් :

| *අනු. අංකය* | *පාඨමාලාවේ නම* | *හදරනු ලැබූ ආයතනය* | *කාලසීමාව* |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |

- සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණන්න.

8. අදළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද පිළිබඳ විස්තර :

| *අනු. අංකය* | *පළපුරුද්ද ලද ක්ෂේත්‍රය* | *කාලසීමාව* | *ආයතනය* |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |

9. වෙනත් සුදුසුකම් :———.

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍යබව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සකු කිරීමටත්, පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත්, මා සේවයෙන් පහකිරීමටත් හැකි බව මම දනිමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද මෙයින් ප්‍රකාශ කරමි.

———,
අත්සන.

දිනය :———.

**අත්සන සහතික කිරීම.** :

මෙම අයදුම්පත ඉදිරිපත්කරන.............................. මහතා/මහත්මිය/මෙනවිය........................... දින ඉහත අත්සන මා ඉදිරිපිටදී තැබූ බව සහතික කරමි.

———,
සහතික කරන අයගේ අත්සන.

දිනය :———.

සහතික කරන අයගේ සම්පූර්ණ නම:———.
තනතුර :———.
ලිපිනය :———.
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

*අත්සන සහතික කිරීම* :
රජයේ විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු හෝ නීතිඥයෙකු හෝ රජයේ මාණ්ඩලික තනතුරක් දරන නිලධාරියෙකු විසින් අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන සහතික කළ යුතුය.

09-817

## විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

### අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු වල පුරප්පාඩු පිරවීම නිලධාරීන් තෝරා ගැනීමට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙනුවෙන්, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් 2018 ජනවාරි මස කොළඹ දී පැවැත්වීමට නියමිත තරග විභාගය සඳහා ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයට අයත්,

| | | |
|---|---|---|
| කෞතුකාගාර ආරක්ෂක | - | තනතුරු පුරප්පාඩු 06 |
| කීට විද්‍යා සහකාර | - | තනතුරු පුරප්පාඩු 02 |
| උද්භිද විද්‍යා සහකාර | - | තනතුරු පුරප්පාඩු 01 |
| මානව විද්‍යා සහකාර | - | තනතුරු පුරප්පාඩු 01 |
| සත්ත්ව විද්‍යා සහකාර | - | තනතුරු පුරප්පාඩු 01 |
| සංරක්ෂණ සහකාර | - | තනතුරු පුරප්පාඩු 01 |

1.1 අධ්‍යාපන සුදුසුකම් :-

- සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.
- ක්ෂේත්‍රයට අදල විෂයයන් දෙකක් (02) සහිතව විෂයයන් තුනකින් (03) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම (සුදුසුකම් පහත පරිදි විය යුතුය.)

*සුදුසුකම් - අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය* :

| *තනතුර* | *සුදුසුකම් - අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය* |
|---|---|
| කීට විද්‍යා සහකාර | අ. පො. ස. (උ/පෙළ) විභාගය ජීව විද්‍යා විෂයය ඇතුළත්ව ජීව විද්‍යා විෂය ධාරාවට අයත් විෂයයන් දෙකකින් (02) එකවර සමත් වී තිබීම.<br>(පැරණි විෂය නිර්දේශයේ සත්ත්ව විද්‍යාව විෂයය සහිතව විෂයයන් තුනකින් (03) සමත් වී තිබීම.) |
| මානව විද්‍යා සහකාර | අ. පො. ස. (උ/පෙළ) විභාගය කලා අංශයෙන් විෂයයන් දෙකකින් (02) එකවර සමත්වී තිබීම. (පැරණි විෂය නිර්දේශයේ විෂයයන් 03කින් සමත් වී තිබීම.) |
| සත්ත්ව විද්‍යා සහකාර | අ. පො. ස. (උ/පෙළ) විභාගය ජීව විද්‍යා විෂයය ඇතුළත්ව ජීව විද්‍යා විෂය ධාරාවට අයත් විෂයයන් දෙකකින් (02) එකවර සමත් වී තිබීම.<br>(පැරණි විෂය නිර්දේශයේ සත්ත්ව විද්‍යාව ඇතුළත්ව විෂයයන් තුනකින් (03) සමත් වී තිබීම.) |
| උද්භිද විද්‍යා සහකාර | අ. පො. ස. (උ/පෙළ) විභාගය ජීව විද්‍යා විෂයය ඇතුළත්ව ජීව විද්‍යා විෂය ධාරාවට අයත් විෂයයන් දෙකකින් (02) එකවර සමත් වී තිබීම.<br>(පැරණි විෂය නිර්දේශයේ උද්භිද විද්‍යාව ඇතුළත්ව විෂයයන් තුනකින් (03) සමත් වී තිබීම.) |
| සංරක්ෂණ සහකාර | අ. පො. ස. (උ/පෙළ) විභාගය රසායන විද්‍යාව විෂයය ඇතුළත්ව විෂයයන් දෙකකින් (02) එකවර සමත් වී තිබීම.<br>(පැරණි විෂය නිර්දේශයේ රසායන විද්‍යා විෂයය ඇතුළත්ව විෂයයන් තුනකින් (03) සමත් වී තිබීම.) |
| කෞතුකාගාර ආරක්ෂක | අ. පො. ස. (උ/පෙළ) විභාගය ජීව විද්‍යා විෂයය ඇතුළත්ව ජීව විද්‍යා විෂය ධාරාවට අයත් විෂයයන් දෙකකින් (02) එකවර සමත් වී තිබීම;<br>හෝ<br>අ. පො. ස. (උ/පෙළ) විභාගය කලා අංශයෙන් ඉතිහාසය විෂයය ඇතුළත්ව විෂයයන් දෙකකින් (02) එකවර සමත් වී තිබීම.<br>(පැරණි විෂයය නිර්දේශයේ ඉහත සඳහන් විෂයයන් ඇතුළත්ව විෂයයන් තුනකින් (03) සමත් වී තිබීම.) |

1.2 වෘත්තීය සුදුසුකම් :

| *තනතුර* | *සුදුසුකම්* |
|---|---|
| කීට විද්‍යා සහකාර | අම්පාරේ හාඩි ආයතනය මගින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (කෘෂිකර්ම) පාඨමාලාව හදරා තිබීම. |
| සත්ත්ව විද්‍යා සහකාර | අම්පාරේ හාඩි ආයතනය මගින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (කෘෂිකර්ම) පාඨමාලාව හදරා තිබීම. |
| උද්භිද විද්‍යා සහකාර | අම්පාරේ හාඩි ආයතනය මගින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (කෘෂිකර්ම) පාඨමාලාව හදාරා තිබීම. |

*සටහන.* - මානව විද්‍යා සහකාර, සංරක්ෂණ සහකාර, කෞතුකාගාර ආරක්ෂක යන තනතුරු සඳහා පුහුණු කිරීමේ ශ්‍රේණියට පමණක් බඳවා ගනු ලැබේ.

කීට විද්‍යා සහකාර, සත්ත්ව විද්‍යා සහකාර, හා උද්භිද විද්‍යා සහකාර යන තනතුරු සඳහා ඉහත 1.1 හි මූලික අධ්‍යාපන සුදුසුකම් සහිතව 1.2හි වෘත්තීය සුදුසුකම් ලබා ඇති විට තාක්ෂණ සේවයේ III වන ශ්‍රේණියට බඳවාගනු ලැබේ. වෘත්තීය සුදුසුකම් සපුරා නොමැති අවස්ථාවල පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවාගනු ලැබේ.

1.3 වෙනත් සුදුසුකම් :

(අ) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
(ආ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(ඇ) 2017.10.30 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 1999.10.30 දිනට හෝ ඊට පෙර හා 1972.10.30 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)
(ඈ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

2.0 වැටුප් ක්‍රමය MN-3-2016

රු.31,040-10x445-11x660-10x730-10x750-රු. 57,550

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව III වන ශ්‍රේණියට අදළ වැටුප් පියවරෙහි තබනු ලැබේ. පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවාගන්නා අය සඳහා උක්ත චක්‍රලේඛය පරිදි අදළ දීමනා ගෙවනු ලැබේ.

3.0 බඳවා ගැනීමේ ක්‍රමය :-

ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

3.1 ලිඛිත විභාගය

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

3.2 ලිඛිත විභාගය විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කානුකූලභාවයත්, ඔහුගේ විශ්ලේෂණ හැකියාවත්, තීරණ ගැනීමේ හැකියාවත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න 40කින් යුක්තය | පැය 01 |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පොදු සාමාන්‍ය දැනීම ප්‍රශ්න 15ක් හා එක් එක් තනතුරට අදළ ක්ෂේත්‍රයන්ගෙන් ප්‍රශ්න 25ක් සහිත බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. විෂයන්ට අදළ ක්ෂේත්‍ර පහත පරිදි වේ. | පැය 01 |
| තනතුරු වලට අදළ විෂය නිර්දේශ | | |
| | 1. කීට විද්‍යා සහකාර තනතුර<br>1. සත්ත්ව රාජධානියේ ආත්‍රපෝඩා වංශයේ (Phylum-Arthropoda ) ඉන්සෙක්ටා වර්ගය (Class-Insecta) පිළිබඳ අවබෝධය<br>2. පර්යේෂණාගාර උපකරණ භාවිතය පිළිබඳ අවබෝධය<br>3. පරිසර විද්‍යාව පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම | |
| | 2. මානව විද්‍යා සහකාර<br>1. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සමාජ අංග හා කලාකෘතීන් පිළිබඳ අවබෝධය පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කරනු ලැබේ. | |
| | 3. සත්ත්ව විද්‍යා සහකාර<br>1. සත්ත්ව රාජධානිය පිළිබඳ අවබෝධය<br>2. පර්යේෂණාගාර උපකරණ භාවිතය පිළිබඳ අවබෝධය<br>3. පරිසර විද්‍යාව පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම | |
| | 4. උද්භිද විද්‍යා සහකාර<br>1. ශාක රාජධානිය පිළිබඳ අවබෝධය<br>2. පර්යේෂණාගාර උපකරණ භාවිතය පිළිබඳ අවබෝධය<br>3. පරිසර විද්‍යාව පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම | |
| | 5. සංරක්ෂණ සහකාර<br>1. රසායන විද්‍යාව පිළිබඳ මූලික දැනුම<br>2. පර්යේෂණාගාර උපකරණ හා අදළ තාක්ෂණික ක්‍රම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම. | |
| | 6. කෞතුකාගාර ආරක්ෂක<br>විද්‍යා අංශය - සත්ත්ව විද්‍යාව හා උද්භිද විද්‍යාව පිළිබඳ මූලික දැනුම<br>සංස්කෘතික අංශය - ශ්‍රී ලංකාවේ සංස්කෘතික අංග, සාම්ප්‍රදායයන් හා ඉතිහාසය පිළිබඳ මූලික දැනුම | |

4.0

4.1 විභාග කොන්දේසි :

i. විභාගයසිංහල,දෙමළ,ඉංග්‍රීසිභාෂාමාධ්‍යවලින්පවත්වනුලැබේ.අපේක්ෂකයන්කැමතිඕනෑමභාෂාමාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකි අතර විභාගයේ සියලුම ප්‍රශ්නපත්‍ර වලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පත්‍රයේ දක්වෙන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර සියල්ලටම පෙනී සිටිය යුතුය.

ii. විභාග ගාස්තුව රු. 600 කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. විභාග ගාස්තු සඳහා මුද්දර ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. එම ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

iii. විභාගය සඳහා ගෙවන ලද විභාග ගාස්තුව කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයකට මාරුකිරීම කරනු නොලැබේ.

iv. මෙම විභාගය 2018 ජනවාරි මස කොළඹ දී පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලබන අතර ඔබ විසින් සඳහන් කරන ලද ලිපිනයට විභාග ප්‍රවේශ පත්‍රයක් එවනු ලැබේ. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කල වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාග යේ නම අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් එලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදනමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත. තවද අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

v. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

vi. *විභාග ප්‍රතිඵල* .- ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයට ලකුණු 40% කට නොඅඩුව ලබාගත් අපේක්ෂකයන් හෝ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක නම් ඇතුළත් වන පරිදි සකස් කළ ප්‍රතිඵල ලේඛනය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www. reults.exams., gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

*සටහන* .- විභාගය සඳහා පෙනී සිටින දින විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

4.2 සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි

මෙම තනතුරු ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වේ. බඳවා ගනු ලබන අයදුම්කරුවන් වැන්දඹු අනත්දරු හා වැන්දඹු පුරුෂ අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

5.0 අයදුම්පත් එවිය යුතු ආකාරය

5.1 අයදුම්පත් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් සකස් කර විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන මාධ්‍යයෙන් තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍ර වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍ර වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, යෙදිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූළ නොවන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර විභාග අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා ඇත්ද යන්න නැවත විමසිලිමත් වන්න. අංක 01 සිට 08 දක්වා වන ශීර්ෂ 01 වන පිටුවට ද අංක 09 සිට 14 දක්වා වන ශීර්ෂ 2 වන පිටුවට ද අංක 15 සිට 18 දක්වා වන ශීර්ෂ 03 වන පිටුවට ද වන පරිදි අයදුම්පත්‍රය සකස් කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

5.2 නියමිත ආකෘතියට අනුකූලව සැකසූ අයදුම්පත් 2017.10.30 දින හෝ එදිනට පෙර ලැබෙනසේ ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, විභාග දෙපාර්තමේන්තුව පැලවත්ත, බත්තරමුල්ල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එක් අපේක්ෂකයෙකුට අයදුම් කළ හැක්කේ එක් තනතුරකට පමණි.

5.3 නිසියාකාරව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් ලැබුණු බව දැන්වනු නොලැබේ.

5.4 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ'' අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය සඳහා බඳවා ගැනීම'' යනුවෙන් තමා අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

6.0 අත්සන සහතික කරවා ගැනීම

- පූජ්‍ය ස්ථාන භාර පූජකවරයෙකු/සමාදන විනිශ්චයකාරවරයෙකු/රජයේ විදුහල්පතිවරයෙකු හෝ රු. 240,360 ට නොඅඩු ආරම්භක වාර්ෂික වැටුපක් හිමි වැටුප් පරිමාණයක සේවය කරනු ලබන රජයේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුය. දැනටමත් රාජ්‍ය ආයතනයක සේවය කරන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතුය.
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛනවලින් ඕනෑම එකක් පිළිගනු ලැබේ.
  - (i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,
  - (ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

7.0 *වෙනත්*.-සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ. මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කරුණක් පිළිබඳව සහ බඳවා ගැනීම් සම්බන්ධව කෞතුකාගාර අධ්‍යක්ෂකගේ තීරණය අවසාන තීරණය වේ.

අධ්‍යක්ෂ (*වැ. බ.*),
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

අංක 53, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

### ආදර්ශ අයදුම්පත්‍රය

***ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ''............................. '' තනතුර සඳහා අයදුම්පත්‍රය***

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

01. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐
සිංහල - 2, දෙමළ -3, ඉංග්‍රීසි - 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. අයදුම්කරන තනතුර : ☐
(අදළ අංකය කොටුව තුළ ලියන්න)
01 - කෞතුකාගාර ආරක්ෂක
02 - කීට විද්‍යා සහකාර
03 - උද්භිද විද්‍යා සහකාර
04 - මානව විද්‍යා සහකාර
05 - සත්ත්ව විද්‍යා සහකාර
06 - සංරක්ෂණ සහකාර

03. අයදුම්කරුගේ නම :
3.1 මුලකුරු සමග නම :
i. සිංහලෙන්/දෙමළෙන් :———.
ii. ඉංග්‍රීසියෙන් (In Block Letters) :———.

3.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :
i. සිංහලෙන්/දෙමළෙන් :———.
ii. ඉංග්‍රීසියෙන් ( In Block Letters) :———.

04. විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :
i. ඉංග්‍රීසියෙන් ( In Block Letters) :———.
ii. සිංහලෙන්/දෙමළෙන් :———.

05. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

06. ස්ත්‍රී/පුරුෂ භාවය : - පුරුෂ - 0 (අදළ අංකය කොටුව තුළ ලියන්න) ☐
ස්ත්‍රී - 1

07. ලිපිනය :
i. පෞද්ගලික ලිපිනය :———.
ii. දිස්ත්‍රික්කය :———.
iii. රාජකාරි ලිපිනය (රැකියාවක් කරන්නේ නම්) :———.

08. දුරකථන අංකය : පෞද්ගලික :———. රාජකාරි :———.

09. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐
2017.10.30 දිනට වයස : අවු. : ☐☐ මාස : ☐☐ දින : ☐☐

10. විවාහක/අවිවාහක බව :———.

11. පුරවැසිභාවය පරම්පරාවෙන්/ලියාපදිංචි වීමෙන් :

12. අධ්‍යාපන සුදුසුකම් :
I. අ.පො.ස. (සා./පෙළ) විභාගය :
විභාග අංකය :———. වර්ෂය :———.
මාධ්‍යය :———.
II. අ.පො.ස. (උ/පෙළ) විභාගය :
විභාග අංකය :———. වර්ෂය :———.
මාධ්‍යය :———.

| | *සමත්වූ විෂයයන්* | *ශ්‍රේණිය* |
|---|---|---|
| (1) | ........................... | ......... |
| (2) | ........................... | ......... |
| (3) | ........................... | ......... |
| (4) | ........................... | ......... |
| (5) | ........................... | ......... |
| (6) | ........................... | ......... |
| (7) | ........................... | ......... |
| (8) | ........................... | ......... |

| | *සමත් වූ විෂයයන්* | *ශ්‍රේණිය* |
|---|---|---|
| (1) | ........................... | ......... |
| (2) | ........................... | ......... |
| (3) | ........................... | ......... |
| (4) | ........................... | ......... |

13. වෘත්තීය දැනුම හා කුසලතාවයන් පිළිබඳ විස්තර :

| *පාඨමාලාව* | *ආයතනය* | *විෂයයන්* | *ප්‍රතිඵල* |
|---|---|---|---|
| | | | |

14. පළපුරුද්ද පිළිබඳ විස්තර :

| *තනතුර* | *ආයතනය* | *සේවයේ නියුක්තව සිටි කාලය* |
|---|---|---|
| | | |

15. නියමිත විභාග ගාස්තු ගෙවා ලබාගත් අංක.......................දරන ලදුපත පහත කොටුවෙහි අලවා ඇත.

16. දැනට යම්කිසි තනතුරක් දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :
1. තනතුර හා ශ්‍රේණිය :———.
2. පත් වූ දිනය :———.
3. ආයතනය :———.
4. විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ද යන වග :———.

අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මා දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

17. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ..................... නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්,......... දින ඔහු /ඇය මා ඉදිරිපිටදී අත්සන් තබන ලද බවත් සහතික කරමි.

———,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :———.
සහතික කරන්නාගේ නම :———.
තනතුර :———.
ලිපිනය :———.
නිල මුද්‍රාව :———.

18. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

.......................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවකයෙකු/සේවිකාවක ලෙස සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව).

දිනය :———.

09-851

---

**රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය**

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2017

1. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියට පත් කිරීම සඳහා වන සීමිත තරග විභාගයේ ලිඛිත පරීක්ෂණය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම විභාග කොමසාරිස් ජනරාල් විසින් ජනවාරි මස දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. මෙම විභාගය පහත සඳහන් නගරවලදී පවත්වනු ලැබේ. විභාග මධ්‍යස්ථාන ස්ථාපනය කරනු ලබන නගර හා ඊට අදාල නගර අංක පහතින් දැක්වේ.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| බදුල්ල | 03 |
| මාතර | 04 |
| යාපනය | 05 |

ඉහත සඳහන් යම්කිසි ස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවුනහොත් එම මධ්‍යස්ථානය අවලංගු කරන අතර, එම අයදුම්කරුවන් යාබද මධ්‍යස්ථානයක් වෙත යොමු කෙරෙනු ඇත. ඉල්ලුම් කරන නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

3. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ට බලය ඇත.

4. 2017.12.31 දිනට අධිශ්‍රේණියේ පුරප්පාඩු වලින් 50% ක ප්‍රමාණයකට අදාළ පත් කිරීම් කරනු ලබන්නේ සීමිත තරග විභාගයක ප්‍රතිඵල මතය. සීමිත තරග විභාගය සමත්වීම සඳහා විභාගයට අදාළ එක් එක් විෂයයන්ට අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගත යුතු ය. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පත් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කෙරෙන සහතික පරීක්ෂා කිරීම සඳහා පමණක් වන අතර එහිදී ලකුණු දීමක් සිදු නොවේ.

5. 2016.02.25 දිනැති හා අංක 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN -7-2016 වැටුප් ඛණ්ඩය මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 41,580 - 11x755 - 10x1,080 - රු. 68,425 ක් වේ. එම වැටුප ඔබට හිමිවන්නේ 2020.01.01 දින සිට වේ. එම චක්‍රලේඛයේ ලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මකවන දින සිට ඔබට වැටුප් ගෙවනු ලැබේ.

6. *සපුරාලිය යුතු සුදුසුකම්* :

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පූර්වාසන්න අවුරුදු 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්තා වූ ඒකාබද්ධ සේවයට අයත්,

(*අ*) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියෙකු වීම;
හෝ
(*ආ*) අවම වශයෙන් සේවයේ වසර අට (08) කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම;
හෝ
(*ඇ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය සමත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු වීම.

7. *අයදුම් කිරීමේ ක්‍රමය* :

(*අ*) අයදුම්පත්‍රය මෙම නිවේදනයේ අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. එය කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සෙ.මී. 25.5x21 (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර තම අත්අකුරින්ම පිරවිය යුතු ය. අංක 01 සිට 04 දක්වා පළමුවන පිටුවට ද, 05 සිට 10 තෙක් දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද වන සේ ගෙන සකස් කළ යුතු ය. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය. අයදුම්පත්‍රය සකස් කර ගත යුත්තේ අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම ය. (සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.)

(*ආ*) අපේක්ෂකයින් විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය, ඡායා පිටපතක් ද සමග තම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු ය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ලබා ගැනීමෙන් පසු ඡායා පිටපත පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කර මුල් පිටපත තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින්,

විභාග කොමසාරිස් ජනාරල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට 2017.10.30 වැනි දිනට ප්‍රථම ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවනු ලබන අයදුම්පත්‍රයට අමතරව වෙනත් කිසිදු අයදුම්පත්‍ර පිටපතක් පෞද්ගලිකව එවීම නොකළ යුතු ය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සෑම අයදුම්පතක්ම සෑම අයුරකින්ම සම්පූර්ණ බව තහවුරු කළ යුතු අතර, ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 14 න් දැක්වෙන ආයතන ප්‍රධානියාගේ සහතිකය ද අත්සන් කළ යුතු ය. අයදුම්පත් විභාග කොමසාරිස් ජනාරාල්ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ අන්‍ය නිලධාරියෙකුගේ හෝ පෞද්ගලික ලිපිනයකට නොඑවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය 2017**" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය. විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවැති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළවන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සළකණු නොලැබේ.

(*ඇ*) (i) පළමුවන වතාවට මෙම විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අයකරනු නොලැබේ. පළමු වතාවට පෙනී සිටින අයදුම්කරුවන් ලෙස සළකන්නේ සාමාන්‍ය ලිපිකාර සේවයේ අධිපන්තියට පත් කිරීම සඳහා 1980, 1982, 1983, 1984, 1985, 1986, 1987, 1988, 1989, 1991, 1996, 1999 හෝ 2001 වර්ෂවල පවත්වන ලද සීමිත තරග විභාගයකට පෙනී නොසිටි අයදුම්කරුවන්ගෙන් හා 1985 හා 1996 වර්ෂවල පවත්වන ලද රජයේ යතුරු ලේඛක සේවයේ අධිපන්තියේ සීමිත තරග විභාගයකට පෙනී නොසිටි අයදුම්කරුවන්ගෙන් හා 1996 වර්ෂයේ දී පවත්වන ලද රජයේ ලඝුලේඛක සේවයේ අධිපන්තියේ සීමිත තරග විභාගයකට පෙනී නොසිටි අයදුම්කරුවන්ගෙන් හා 1999 වර්ෂයේ දී පවත්වන ලද රජයේ පොත් තබන්නා සේවයේ/රජයේ සරප් සේවයේ හෝ රජයේ ගබඩා භාරකාර සේවයේ අධිපන්තියේ සීමිත තරග විභාගයකට හා 2006, 2007, 2011 සහ 2015 වර්ෂවලදී පවත්වන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියට උසස් කිරීමේ සීමිත තරග විභාගයන් යන විභාග අතුරෙන් එකදු විභාගයකට හෝ පෙනී නොසිටි අයදුම්කරුවන් පමණකි.

(ii) විභාග සඳහා ගාස්තුව රු. 600.00කි. තව ද එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003.02.13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක්/ උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන ලෙස ඇලවිය යුතු ය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ. එසේම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැක.

(*ඈ*) අයදුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලිපියක් හෝ තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බලනු නොලැබේ.

(*ඉ*) අයදුම්පත්‍ර ලැබුණ බව දන්වනු නොලැබේ.

08. **විභාගයට ඇතුළත් කර ගැනීම** :

(*අ*) අදාළ විභාග ගාස්තු ගෙවා, නිසි ලෙස අයදුම්පත්‍ර සම්පූර්ණ කර, නියමිත දිනට පෙර එවා ඇති සියලුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපති වෙත විභාග දිනයේ දී ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශපත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

(*ආ*) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(*ඇ*) අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයෙහි පිටපත ද, විභාග ගාස්තු ගෙවන ලද්දේ නම් ඊට අදාළ ලදුපතෙහි පිටපත ද අතැතිව, ඔබගේ සම්පූර්ණ නම හා ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක පදිංචිකරුවෙකු නම් ඔබගේ ඉහත විස්තර හා ප්‍රවේශපත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින්ම විමසා සිටීම ද ඵලදායී වනු ඇත.

*සටහන* :- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ.

09. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය* :-

අපේක්ෂකයන් විසින් තමන් ඉදිරිපත් වන එක් එක් විෂයය සඳහා විභාග ශාලාධිපති වෙත තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තුමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

10. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :-

(*අ*) මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකි ය.

(*ආ*) අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය විසින් හිතා මතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහු/ඇය තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සළකා බලනු නොලබන අතර මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

11. *විභාග මාධ්‍යය* :- මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් විසින් තමන් සේවයට ඇතුළත්වීම සඳහා තරග විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ වෙනත් රාජ්‍ය භාෂා මාධ්‍යයකින් හෝ පිළිතුරු සැපයිය යුතු ය. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12. *විභාග පරිපාටිය* : - ලිඛිත පරීක්ෂණය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* |
|---|---|---|
| (1) කාර්යාල කළමනාකරණය | පැය 2 | 100 |
| (2) කාර්යාල ක්‍රම | පැය 2 | 100 |
| (3) ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති | පැය 2 | 100 |
| (4) රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | පැය 2 | 100 |
| (5) පොදු ප්‍රශ්න පත්‍රය | පැය 1 1/2 | 100 |

13. *විෂයය නිර්දේශය* :-

අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් විෂයයන් පිළිබඳව දැනුමක් අපේක්ෂා කරනු ලැබේ.

(i) **කාර්යාල කළමනාකරණය** (කාලය පැය 02යි ලකුණු 100)
සංවිධාන ව්‍යුහය, සංවිධාන පිළිබඳ මූලධර්මය, කාර්ය විශ්ලේෂණය හා කාර්ය ඇගයුම් නායකත්වය, අධීක්ෂණය හා තීරණ ගැනීමේ හැකියාව, සංදේශනය, මහජන සම්බන්ධතාවය සම්බන්ධීකරණය හා ගැටලු නිරාකරණය.

(ii) **කාර්යාල ක්‍රම** (කාලය පැය 02යි ලකුණු 100)
කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම, කාර්යාල පටිපාටි, ලේඛන සහ ගොනු කිරීම, ආකෘති පත්‍ර පාලනය හා ආකෘති පත්‍ර සැලසුම් කිරීම, ලිපි ගනුදෙනු කිරීම, කාර්යාල උපකරණ භාවිතය පිළිබඳ පාලනය කාර්යාලයේ සැලැස්ම හා වටපිටාව, ඍකියා විස්තරය, වැඩ අධ්‍යයනය හා ක්‍රම අධ්‍යයනය, වැඩ මැනීම, කාර්යාල මෙහෙයුම් අත්පොත.

(iii) **ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති** (කාලය පැය 02යි ලකුණු 100)
රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග, රාජ්‍ය නිලධාරීන්ගේ ආයතනික කටයුතු, පෞද්ගලික ලිපිගොනුවක් පවත්වාගෙන යාම, රාජ්‍ය සේවකයන් පත් කිරීම, මාරු කිරීම උසස් කිරීම හා සේවය අවසන් කිරීම යන කාර්යයන්හි බලතල පැවරීම, සුභ සාධනය, රාජ්‍ය නිලධාරීන්ට හිමි වරප්‍රසාද, ආයතන කාර්ය පිළිබඳව රජය විසින් මෙතෙක් නිකුත් කර ඇති රෙගුලාසි හා චක්‍රලේඛ පිළිබඳව සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ.

(iv) **රාජ්‍ය මූල්‍ය කළමනාකරණය** (කාලය පැය 02 යි ලකුණු 100)

වාර්ෂික ඇස්තමේන්තු හා ගණන් දීමේ නිලධාරියෙකුගේ වගකීම්, මුදල් පාලනය, මූල්‍ය වගකීම් පැවරීම, මුදල් භාර ගැනීම, ගිණුම්ගත කිරීම හා ප්‍රතිග්‍රහණය කිරීම, ගෙවීම්, රාජ්‍ය මුදල් භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්, සැපයුම් හා සේවාවන්, ප්‍රසම්පාදන කටයුතු, භාණ්ඩ සමීක්ෂණ, විගණන විමසුම්, රජයේ කාර්යාලවල භාවිත වන ලෙජර්, ආදායම් හා වියදම් සාරාංශ, බැංකු සැසඳුම් හා මූල්‍ය පාලන පොත්පත්, රාජ්‍ය මුදල් භාවිතය පිළිබඳ මෙතෙක් නිකුත් කර ඇති චක්‍රලේඛ හා රෙගුලාසි පිළිබඳ සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ.

(v) පොදු ප්‍රශ්න පත්‍රය (කාලය පැය 1 1/2 යි - ලකුණු 100) රාජ්‍ය පරිපාලනයේ ස්වභාවය, රාජ්‍ය පරිපාලන ව්‍යුහය, රාජ්‍ය ප්‍රතිපත්ති හා නව රාජ්‍ය ප්‍රතිසංස්කරණ, මූලික අයිතිවාසිකම්, මානව හිමිකම් කොමිෂන් සභාව, ඔම්බුඩ්ස්මන්වරයා, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව, කාර්යාල සංස්කෘතිය, ආචාරධර්ම හා සාරධර්ම, මැනවින් කාර්යාල භෞතික පරිසරය නිර්මාණය කිරීම සහ කාර්ය මණ්ඩලයේ සුභ සාධන කටයුතු, නිල තත්ත්වය හා සිවිල් තත්ත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක පිළිගැනීම්, සේවාලාභීන්ට රාජ්‍ය නිලධාරීන්ගෙන් ඉටුවිය යුතු යුතුකම්.

14. *පත්කිරීම සඳහා තෝරාගැනීම* :-

(i) ඉහත විභාගය සමත් වී සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා එක් එක් විෂයය සඳහා යටත් පිරිසෙන් ලකුණු 40 බැගින්වත් ලබා ගත යුතු වේ. විභාගයේ දී ලබා ගන්නා මුළු ලකුණුවල එකතුව අනුව සැකසෙන කුසලතා අනුපිළිවෙල අනුව අයදුම්කරුවන් සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් හමුවට කැඳවනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදු නොවේ. තෝරා ගනු ලබන අපේක්ෂකයන් පුරප්පාඩු පවතින දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පිහිටි කාර්යාලයක සේවය කිරීමට සූදානම් විය යුතුය. අනුයුක්ත කෙරෙන කාර්යාලයේ පත්වීම් භාරගැනීම ප්‍රතික්ෂේප කළහොත් ඔහුගේ/ඇයගේ පත්වීම අවලංගු කර ඊළඟට සුදුසුකම් ලබන අයවලුන් පිළිවෙලින් කැඳවා පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

(ii) පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03 ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(iii) ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය රාජ්‍ය සේවා කොමිෂමේ දැනුම් දීමට අනුව ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා දෙනු ඇත. සෙසු අපේක්ෂකයින්ගේ ප්‍රතිඵල www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළකිරීම හෝ පෞද්ගලිකව දන්වා යැවීම සිදු කෙරෙනු ඇත.

15. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලට ද අංක 1840/34 හා 2013 දෙසැම්බර් මස 11 වැනි දින රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවේ දැනටමත් කර ඇති හෝ මතුවටත් කරනු ලබන සංශෝධනවලට ද යටත්ව මෙම විභාගය පැවැත්වීම සහ අධිශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලැබේ.

16. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමටද, මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

17. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2017 සැප්තැම්බර් මස 15 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම්පත්‍රය

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2017

Limited Competitive Examination for Appointment to Supra Grade of Public Management Assistants Service - 2017

විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව අයදුම්කරු විභාගයට පෙනීසිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය
නගරයේ නම නගර අංකය

01. ඔබ අයත්වන්නේ ඒකාබද්ධ සේවයට ද, එසේ නොමැති නම් කුමන පළාත් රාජ්‍ය සේවයට ද යන වග :
(ඔබ අයත්වන රාජ්‍ය සේවයට අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(බස්නාහිර පළාත් රාජ්‍ය සේවය - 01, මධ්‍යම පළාත් රාජ්‍ය සේවය - 02, දකුණු පළාත් රාජ්‍ය සේවය - 03, උතුරු පළාත් රාජ්‍ය සේවය - 04, නැගෙනහිර පළාත් රාජ්‍ය සේවය - 05, වයඹ පළාත් රාජ්‍ය සේවය - 06, උතුරු මැද පළාත් රාජ්‍ය සේවය - 07, ඌව පළාත් රාජ්‍ය සේවය - 08, සබරගමු පළාත් රාජ්‍ය සේවයට - 09, ඒකාබද්ධ සේවය -10)

02. 2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: SILVA , A. B. C. D

2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :————.

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.4 ජාතික හැඳුනුම්පත් අංකය :

03. 3.1 රාජකාරී ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට එවනු ලැබේ)
3.2 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
3.3 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.4 දුරකථන අංකය :

04. උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

05. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

පුරුෂ - 0
ස්ත්‍රී - 1

06. විවාහක/අවිවාහක බව : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

අවිවාහකයි - 1
විවාහකයි - 2

07. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට වයස :

අවුරුදු : මාස : දින :

08. මෙම විභාගය 1980, 1982, 1983, 1984, 1985, 1986, 1987, 1988, 1989, 1991, 1996, 1999 හා 2001 යන වර්ෂවල පවත්වන ලද සාමාන්‍ය ලිපිකාර සේවයේ / 1985, 1999 රජයේ යතුරුලේඛක සේවයේ / 1996 රජයේ ලඝු ලේඛක සේවයේ / 1999 රජයේ පොත් තබන්නා සේවයේ / 1999 රජයේ සරප් සේවයේ හෝ 2006, 2007,2011, 2015 වර්ෂවලදී පවත්වන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියට උසස් කිරීමේ සීමිත තරග විභාගවලින් කවරකට හෝ ඔබ පෙනී සිටියේද? :————.

09. (i) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට/සාමාන්‍ය ලිපිකාර සේවයට/රජයේ යතුරු ලේඛක සේවයට/රජයේ ලඝුලේඛක සේවයට/රජයේ පොත් තබන්නා සේවයට/රජයේ සරප් සේවයට/රජයේ ගබඩා භාරකාර සේවයට පත් වූ දිනය :————.

(ii) අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට එහි මුළු සේවා කාලය :

අවුරුදු : මාස : දින :

(iii) අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ ලබා ඇති වැටුප් රහිත නිවාඩු දින ගණන :————.

(iv) අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සක්‍රීය සේවා කාලය :

අවුරුදු : මාස : දින :

(v) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ/සාමාන්‍ය ලිපිකාර සේවයේ/රජයේ යතුරු ලේඛක සේවයේ/රජයේ ලඝුලේඛක සේවයේ/රජයේ පොත් තබන්නා සේවයේ/රජයේ සරප් සේවයේ/රජයේ ගබඩා භාරකාර සේවයේ පත්වීම ස්ථිර කරන ලද දිනය :————.
(vi) දැනට සිටින ශ්‍රේණිය හා ඊට ඇතුලත් වූ දිනය :————.
(vii) ඔබ උපාධිධාරියෙකු නම් උපාධිය ලැබූ වර්ෂය, විශ්ව විද්‍යාලයේ නම :————.
(viii) උපාධිය වලංගු වන දිනය :————.

10. (i) ඔබ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට/සාමාන්‍ය ලිපිකාර සේවයට/රජයේ යතුරු ලේඛක සේවයට/රජයේ ලඝුලේඛක සේවයට/ රජයේ පොත් තබන්නා සේවයට/ රජයේ සරප් සේවයට/රජයේ ගබඩා භාරකාර සේවයට ඇතුළත්වීමේ තරග විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.

(ii) තරග විභාගයක් රහිතව ඔබ සාමාන්‍ය ලිපිකාර සේවයට/රජයේ යතුරු ලේඛක සේවයට/රජයේ ලඝුලේඛක සේවයට/රජයේ පොත් තබන්නා සේවයට/රජයේ සරප් සේවයට/රජයේ ගබඩා භාරකාර සේවයට බඳවා ගන්නා ලද්දේ නම් එම සේවයට ඇතුලත් වීම සඳහා ඔබ සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යය :————.

11. ඔබගේ පෞද්ගලික ලිපි ගොනුව පවත්වාගෙන යන කාර්යාලය සහ ආයතන ප්‍රධානියාද, ඇතුළුව ලිපිනය පැහැදිලිව සඳහන් කරන්න. :————.

12. මුදල් කුවිතාන්සිය (ලදුපත) මනා ලෙස අලවන්න.

විභාග ගාස්තු ගෙවන ලද මුදල් භාරගැනීමේ කුවිතාන්සිය (ලදුපත) නොගැලවෙන සේ මෙහි අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

13. *අයදුම්කරුගේ ප්‍රකාශය* :

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පූර්වාසන්න අවුරුදු 05 තුළ ලැබිය යුතු සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත් (සේවා හා දෙපාර්තමේන්තුමය පරීක්ෂණ පැවැත්වීම කොන්දේසියක් වන වේතනාධික හැර) එම කාලය තුළ කවර ආකාරයක හෝ කිසිදු විනයානුකූල දඬුවමක් ලබා නැති බවත් ප්‍රකාශ කරමි.

මෙම විභාගයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත්, ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ .............. වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/*විභාග ගාස්තු ගෙවන ලද අංක ................ හා .................... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මෙයට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වෙමි. තවද විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

14. ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ................................ මයා/මිය/මෙනවිය*........................... වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ....................... දිනට පූර්වයෙන් වූ සතුටුදායක පස් අවුරුදු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයෙහි ඇති වාර්තා ආශ්‍රයෙන් මම පුද්ගලිකව පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත්, ඔහු/ඇය* විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබීමට සුදුසු බවත්/ නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත්*, අදාල ගැසට් නිවේදන ප්‍රකාර විභාගයට පෙනී සිටීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් සපුරා ඇති බවත්, විභාග කොමසාරිස් ජනරාල්ගේ අංක 13 හා 1972.10.02 වැනි දින දරන චක්‍රලේඛ ලිපියෙහි පරිදි ඒ බවට සටහනක් නිලධාරියාගේ චර්යා සටහන් පත්‍රයෙහි තබන්නට යෙදුණ බවත්, .......................... .......... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි. ඔහු/ඇය* රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කරන ලද ලිපියේ/පත්වීම් ලිපියේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංකය .................. හා දිනය ................... වේ.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාව යොදන්න)

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත/ විවෘත තරග විභාගය - 2017**

මෙම නිවේදනයේ "සේවයේ" යන පදයෙන් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය (ශ්‍රී ලං.ක්‍ර.සේ.) අදහස් කෙරේ.

1. *විභාග දිනය :*

විභාග කොමසාරිස් ජනරාල් විසින් 2018 ජනවාරි මස කොළඹ දී හා යාපනයේ දී විභාගය පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

2. පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය :

මෙය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

3. *සේවා කොන්දේසි :*

රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, අංක 1670/32 සහ 2010 සැප්තැම්බර් 10 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ.

4. *ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය :*

2016.01.01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි එස්.එල්.1-2016 වැටුප් කාණ්ඩය අනුව,

*මාසික වැටුප් පරිමාණය :*

SL 1-2016 - රු.47, 615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු.110, 895/-

(2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

5. *සුදුසුකම් :*

5.1 විවෘත තරග විභාගය

(අ) *අධ්‍යාපන සුදුසුකම් :*

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පළමුවැනි පන්තියේ හෝ දෙවන පන්තියේ සාමාර්ථයක් සහිත උපාධියක් ලබා තිබීම

හෝ

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ පාර්ලිමේන්තු පනතකින් සංස්ථාපනය වූ පුහුණු ආයතනයකින් ප්‍රදානය කෙරෙන යටත් පිරිසෙයින් වසරකට නොඅඩු පාඨමාලා කාල සීමාවක් සහිත පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

(ආ) *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

(ඇ) *වෙනත් සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) විවෘත තරග විභාගය සඳහා දෙවරකට වඩා පෙනී සිටීමට කිසිදු තැනැත්තෙකුට අවසර නොමැත.
(iv) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
(v) සේවයට පත් කිරීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු, 5.1 (අ) ඡේදයෙහි සඳහන් සුදුසුකම් 2017 සැප්තැම්බර් 29 දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන දිනට) සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඈ) *වයස :*

2017 සැප්තැම්බර් 29 දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන දිනට) වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 28 ට නොවැඩි විය යුතුය.

(ඉ) ලිඛිත විභාගය (1 පරිශිෂ්ඨය බලන්න)

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය (අවම)* |
|---|---|---|
| අවබෝධය | 100 | 40 |
| බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| සාමාන්‍ය සම්ප්‍රජානනය | 100 | 40 |

5.2 සීමිත තරග විභාගය

(අ) *අධ්‍යාපන සුදුසුකම්.*-විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

(ආ) *පළපුරුද්ද.*-සිය පත්වීම්වල ස්ථිර කර ඇති, අයදුම්පත් කැඳවීමේ නිවේදනය, ගැසට් පත්‍රයේ පළ කරන දිනට හෝ ඊට පෙර ඉහත (අ) හි සඳහන් සුදුසුකම් සහිත රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ MN - 1 - 2016 වැටුප් පරිමාණයේ හෝ ඉන් ඉහළ වැටුප් පරිමාණයන් අදාළ වන තනතුරක අවුරුදු පහකට නොඅඩු අඛණ්ඩ, ස්ථිර හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

එමෙන්ම අංක 09/0967/306/061 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සම්බන්ධයෙන් 2009.06.10 දිනැති අමාත්‍යමණ්ඩල අනුමැතිය පරිදි ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ II පන්තියේ II ශ්‍රේණියට අධිසේවක පදනම මත පත්වීම් ලද, දැනට ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියට අන්තර් ග්‍රහණය කර ඇති නිලධාරීන්ට ද සීමිත විභාගය සඳහා අයදුම් කළ හැකිය.

(ඇ) *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

(ඈ) වෙනත් සුදුසුකම් :

(i) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(ii) අයදුම්කිරීමට සුදුසුකම් ලැබීමට පූර්වාසන්නයෙන් වූ වසර පහක කාලසීමාව තුළ නියමිත දිනයන්හි සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
(iii) 2017 සැප්තැම්බර් 29 දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන දිනට) පූර්වාසන්නයෙන් වූ වසර පහක කාලසීමාව තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම.
(iv) සීමිත තරග විභාගය සඳහා දෙවරකට වඩා පෙනී සිටීමට කිසිදු තැනැත්තෙකුට අවසර නොමැත.
(v) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
(vi) සේවයට පත්කිරීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලැබීමට අයදුම්කරු, 5.2 (ආ) ඡේදයන්හි සඳහන් සුදුසුකම් 2017 සැප්තැම්බර් 29 දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන දිනට) සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඉ) බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත විභාගය ( 2 පරිශිෂ්ඨය බලන්න)

| *පරීක්ෂාකර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අවබෝධය | 100 | 40 |
| විෂයානුබද්ධ අධ්‍යයනය | 100 | 40 |
| ක්‍රම සම්පාදනය | 100 | 40 |

6. විභාග ගාස්තු :

විවෘත තරග විභාගයට ගාස්තුව රු. 1,000 කි. සීමිත තරග විභාග ගාස්තුව රු. 1,000 කි. අපේක්ෂකයෙකු විභාග දෙකටම ඉල්ලුම් කළහොත් ගාස්තුව රු. 1,500 කි. මෙම ගාස්තුව විභාග ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට පළමුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැර කිරීම සඳහා දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවිය යුතුය. තැපැල් කාර්යාලයෙන් ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතුය. ලදුපතෙහි ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබා ගැනීම ඉතාම යෝග්‍ය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

7. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට යාකොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කරමින් ඒ-4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර අපේක්ෂකයා විසින්ම පිරවිය යුතුය.

(ආ) ඉල්ලුම්පත්‍රය අංක 01 සිට 03 තෙක් ශීර්ෂ පළමු පිටුවටද, අංක 04 සිට 07 දක්වා ශීර්ෂ දෙවන පිටුවටද ඉතිරිය තෙවන පිටුවට ද වන ලෙස පිළියෙල කළ යුතුය. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍ර වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින ඉල්ලුම්පත් කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව ඉල්ලුම්කරුවන් විසින් දරාගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

සටහන.- "අයදුම්පත්‍රයේ ද, විභාගය සඳහා වන ප්‍රවේශපත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, රු. 240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ ලවා සහතික කරවා ගත යුතුය."

(ඇ) විවෘත තරග විභාගය සඳහා වූ ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් 2017 ඔක්තෝබර් මස 27 වැනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන පිණිස විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "විවෘත තරග විභාගය, ක්‍රමසම්පාදන සේවය III ශ්‍රේණිය" යනුවෙන් පැහැදිලි ලෙස ලිවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

*සටහන* : රජයේ සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත, විවෘත තරග විභාගයට පෙනී සිටින ඉල්ලුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) සීමිත තරග විභාගය සඳහා වූ ඉල්ලුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් 2017 ඔක්තෝබර් මස 27 වැනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන පිණිස විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙලවරේ "සීමිත තරග විභාගය, ක්‍රමසම්පාදන සේවය III ශ්‍රේණිය" යනුවෙන් පැහැදිලි ලෙස ලිවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

සීමිත හා විවෘත තරග විභාග දෙකටම පෙනී සිටින්නේ නම් ලිපි කවරයේ වමත් පස ඉහළ කෙලවරේ "සීමිත/විවෘත තරග විභාගය, ක්‍රමසම්පාදන සේවය III ශ්‍රේණිය" යනුවෙන් සඳහන් කළ යුතුය.

(ඉ) විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශපත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුවන්ගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

8. විභාගයට ඇතුළත්වීම :

(අ) ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත්‍ර යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු නිසි පරිදි අත්සන සහතික කළ තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයෙකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය පළමුවෙන් එම ශාලාවේදී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රයේ පළ කර ඇත.

(ඇ) අපේක්ෂකයෙකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනු ඇත.

9. අපේක්ෂකයාගේ අනන්‍යතාවය :

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,
(ආ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය.

10. සාවද්‍යය තොරතුරු සැපයීම :

අපේක්ෂකයෙකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු ඕනෑකමින් යටපත් කර ඇති නම්, ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

11. මෙම රෙගුලාසිවල සලසා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

12. විභාග ක්‍රමය :

විභාග මාධ්‍යය :

(අ) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පවත්වනු ලැබේ.
(ආ) අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය.

*සටහන :*

(I) අපේක්ෂකයින් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂාවකින් පමණි.
(II) අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

13. පරීක්ෂා කිරීමේ ක්‍රමය :

13.1. විවෘත තරග විභාගය :

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ලිඛිත විභාගයක් :

(I) අවබෝධය - කාලය පැය 02යි - ලකුණු 100
(II) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01යි - ලකුණු 100
(III) සාමාන්‍ය සම්ප්‍රජානනය - කාලය පැය 03යි - ලකුණු 100

13.2 සීමිත තරග විභාගය

(I) අවබෝධය - කාලය පැය 02යි - ලකුණු 100
(II) විෂයානුබද්ධ අධ්‍යයනය - කාලය පැය 01යි - ලකුණු 100
(III) ක්‍රමසම්පාදනය - කාලය පැය 02යි - ලකුණු 100

විෂය නිර්දේශයන් මෙම නිවේදනය අවසානයේ දැක්වේ.

13.3. සම්මුඛ පරීක්ෂණය :

ලිඛිත ප්‍රශ්නපත්‍රවලින් එක් එක් විෂයය සඳහා අවම වශයෙන් 40% ක ප්‍රතිශතයක් ලබා ඇත්තා වූ අපේක්ෂකයින් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව, අවස්ථාවෝචිත පරිදි ලිඛිත විභාගයේදී ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා අදාළ පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

13.4. ප්‍රතිඵල නිකුත් කිරීම :

ගැසට් නිවේදනයේ 13.1, 13.2 හා 13.3 ඡේද අනුව විභාගයට පෙනී සිට සුදුසුකම් ලබන අපේක්ෂකයින්ගේ එක් එක් විෂයය සඳහා ලැබූ ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙලට සකස්කළ ප්‍රතිඵල ලේඛන ලේකම්, රාජ්‍ය සේවා කොමිසම වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

14. පත් කිරීම පිණිස තෝරා ගැනීමේ ක්‍රමය :

විවෘත හා සීමිත තරග විභාගවලට ලිඛිත පරීක්ෂණවලින් ඉහළම ලකුණු ලබා ගෙන ඇති කුසලතා අනුපිළිවෙල අනුව හා මූලික සුදුසුකම් සපුරා ඇති අය තෝරා ගනු ලැබේ. අපේක්ෂකයින් කිහිප දෙනෙකුට එකම ලකුණු ලැබී ඇත්නම් තෝරා ගැනීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2017 සැප්තැම්බර් මස 14 වැනි දින.

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත/විවෘත තරග විභාගය - 2017

## OPEN/LIMITED COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO GRADE III OF THE SRI LANKA PLANNING SERVICE - 2017

| | |
|---|---|
| විභාග අංකය :<br>(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා) | |
| විභාගයට පෙනී සිටින නගරය | එම නගර අංකය |
| ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය සඳහන් කරන්න.<br>(කොළඹ - 1, යාපනය - 2) * නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. | ☐ |
| විභාගයට පෙනී සිටින මාධ්‍යය :<br>සිංහල - 2 , දෙමළ - 3, ඉංග්‍රීසි - 4<br>(අදාළ අංකය කොටුව තුළ ලියන්න) * විභාග මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. | ☐ |
| ඔබ අයදුම් කරන්නේ විවෘත විභාගය ද / සීමිත විභාගය ද නැතහොත් දෙකම ද යන වග<br>සීමිත - 1, විවෘත - 2, දෙකටම - 3 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)<br>*අයදුම් කරන විභාගය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. | ☐ |

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————. (උදා : GUNAWARDHANA, H.M.S.K)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.0 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.1 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

2.2 රාජකාරි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.3 රාජකාරි ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

2.4 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙකු ඔහුගේ රාජකාරි ලිපිනය ලිවිය යුතුයි. ලිපිනයෙහි වෙනසක් වුනි නම්, එය වහාම දැන්විය යුතුය.)

3.0 3.1 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

3.2 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1, පුරුෂ - 0 (අදාළ අංකය ලියන්න) ☐

3.3 විවාහක/අවිවාහක බව : විවාහක - 1, අවිවාහක - 2 (අදාළ අංකය ලියන්න) ☐

3.4 උපන් දිනය: වර්ෂය: ☐☐☐☐ මාසය : ☐☐ දිනය: ☐☐

3.5 2017.09 .29 දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

4.0 (විවෘත තරග විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විසින් පිරවීම සඳහාය) පහත විස්තර සපයන්න.

4.1 නිවේදනයේ 5.1 ඡේදය යටතේ මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සෙකු වීම පිණිස ලැබූ සුදුසුකම් :————.

4.2 එම සුදුසුකම් ලබාගත් ආයතන :————.

5.0 (සීමිත තරග විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විසින් පිරවීම සඳහාය) පහත විස්තර සපයන්න.

5.1 නිවේදනයේ 5.2 ඡේදය යටතේ මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සෙකු වීම පිණිස ලැබූ සුදුසුකම් :————.

5.2 එම සුදුසුකම් ලබා ගත් ආයතන :

(අ)

| *සේවය කර ඇති දෙපාර්තමේන්තුව* | *තනතුර* | *සිට* | *දක්වා* | *කාල සීමාව* |
|---|---|---|---|---|
| | | | | |

(ආ) (i) සේවය/තනතුර : ..........................................................
(ii) පන්තිය : ........................................ වැනි දින සිට
(iii) පන්තිය : ........................................ වැනි දින සිට

(iv) 2017.09.29 දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන දිනට) රජය යටතේ මුළු සේවා කාලය :

අවුරුදු : ...................................... මාස : ..................................

අ. ඉහත ii හි සේවය අවුරුදු : ......................... මාස : ......................
ආ. ඉහත iii හි සේවය : අවුරුදු : ......................... මාස : ......................

v. 2017.09.29 දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන දිනට) වාර්ෂික වැටුප : .................................. ...........................

6.0 6.1 ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගයට ඔබ පෙනී සිටි වර්ෂ:
1. ...................... 4. ........................
2. ...................... 5. ........................
3. ...................... 6. ........................

6.2 ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගයට ඔබ පෙනී සිටි වර්ෂ:
1. ......................
2. ......................
3. ......................

7.0 මුදල් කුවිතාන්සිය නොගැලවෙන ලෙස අයදුම්පතට අලවන්න.

| කුවිතාන්සිය ඇලවීම සඳහා |
|---|

(i) අංකය : .................................. (iii) මුදල් ගෙවූ ස්ථානය : ...............................
(ii) දිනය : ................................. (iv) ගෙවන ලද මුදල : රුපියල් ..................

8.0 අයදුම්කරුගේ සහතිකය :

8.1 මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තුව ගෙවන ලද අංක ............................. හා ............................. දින දරන මුදල් කුවිතාන්සිය මීට අමුණා ඇති බවත්, ප්‍රකාශ කරමි. තවද, විභාග නීතිරීති අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසු හෝ මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකටත් මම එකඟ වෙමි.

8.2 2017 සැප්තැම්බර් 29 දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන දිනට) පූර්වාසන්නයෙන් වූ පස් අවුරුද්දක් තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීම කොන්දේසියක් වන වේතනාධිකය හැර) වේතනාධික සියල්ල මා විසින් උපයා ගෙන ඇති බවත්, (අවවාද කිරීම හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් මම ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9.0 9.1 අත්සන සහතික කිරීම :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................................... නැමැති අයදුම්කරු මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී මෙහි අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන හා මුද්‍රාව.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය:————.

සටහන : සහතික කරන අය සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයෙකු, නොතාරිස්වරයෙකු හෝ වසරකට රු.240,360 කට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු විය යුතුය.

9.2 *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* .- (සීමිත තරග විභාගයට පෙනී සිටින සියලුම අයදුම්කරුවන් හා අදාළ වන විට පමණක් විවෘත තරග විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතුය.) තමන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යන කාර්යාලයේ ප්‍රධානියා ආයතන ප්‍රධානියා වශයෙන් අත්සන් කළ යුතුය.

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................................... නැමැති අයදුම්කරු .............. ..................... වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත්, ඉහත 06 හි සඳහන් කර ඇති සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පුද්ගලිකව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, 2017 ............................ මස .............. වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
පදවිය :————.
ලිපිනය : (රබර් මුද්‍රාවකින් සනාථ කරන්න)

### 1 වැනි පරිශිෂ්ඨය

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියේ පත් කිරීම් සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගයේ විෂය නිර්දේශ පිළිබඳ විස්තර :**

මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| *අංකය* | *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් විය යුතු ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|---|
| 1 | අවබෝධය | 100 | 40 | පැය 02 යි. |
| 2 | බුද්ධි පරීක්ෂණය | 100 | 40 | පැය 01 යි. |
| 3 | සාමාන්‍ය සම්ප්‍රජානනය | 100 | 40 | පැය 03 යි. |

**විෂයය නිර්දේශයන් :**

*විෂයය අංක 01 අවබෝධය*

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. එක් එක් කොටස සඳහා සමාන ලකුණු හිමි වේ.

1 වැනි කොටස
මෙම කොටසට රචනයක් හා සාරාංශයක් ලිවීම ඇතුළත් වේ.

II වැනි කොටස
භාෂාව පිළිබඳ අපේක්ෂකයාගේ වැටහීම පරීක්ෂා කිරීම පිණිස සැකසුණු පාඨ කිහිපයකින් දෙවැනි කොටස සමන්විත වේ. මෙම පාඨ ආශ්‍රයෙන් යටින් ඉරි ගැසූ පදයන්ගේ අර්ථය තනි වාක්‍යයකින් ප්‍රකාශ කරන ලෙස හෝ ඒ පිළිබඳ විවරණාත්මක සටහන් ලියා දක්වන ලෙස හෝ විකල්පයන් කාණ්ඩයකින් ඉතාමත්ම උචිත ප්‍රකාශය තෝරා දක්වන ලෙස හෝ දී ඇති ප්‍රශ්නය සඳහා පිළිතුරු කිහිපයක් අතරින් නිවැරදි පිළිතුර තෝරා දක්වන ලෙස හෝ අපේක්ෂකයින්ට නියම කරනු ලැබේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*විෂයය අංක 02 - බුද්ධි පරීක්ෂණය*

අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණය සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළැඹීමේ හැකියාව පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය බහුවරණ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*විෂයය අංක 03 - සාමාන්‍ය සම්ප්‍රජානනය*

මෙම ප්‍රශ්න පත්‍රය සම්පාදනය කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ භූගෝලීය, දේශපාලනීය, ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික පරිසරය ඇතුළු ශ්‍රී ලංකාවේ මුළු පරිසරය පිළිබඳව සහ අන්තර් ජාතික වශයෙන් වැදගත් වන්නාවූ කාලීන තත්ත්වයන් මෙන්ම විද්‍යාත්මක සහ තාක්ෂණ වර්ධනයන් පිළිබඳව ද ඔහු තුළ ඇති සම්ප්‍රජානනය පිරික්සීම සඳහාය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

සටහන :

(I) අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතුය,
(II) තම ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් මාධ්‍ය වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ,

*(අ)* මෙම විභාගය සිංහල හෝ දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පැවැත්වේ.
*(ආ)* අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක.

**2 වැනි පරිශිෂ්ඨය**

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියට පත් කිරීම් සඳහා පවත්වනු ලබන සීමිත තරග විභාගයේ විෂය නිර්දේශ පිළිබඳ විස්තර :

මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| *අංකය* | *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් විය යුතු ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|---|
| 1 | අවබෝධය | 100 | 40 | පැය 02 යි. |
| 2 | විෂයානුබද්ධ අධ්‍යයනය | 100 | 40 | පැය 01 යි. |
| 3 | ක්‍රමසම්පාදනය | 100 | 40 | පැය 02 යි. |

**විෂයය නිර්දේශයන් :**

විෂයය අංක 01 - අවබෝධය

පාඨ කාණ්ඩ අපේක්ෂකයා හමුවේ තබනු ලැබේ. මින් ඇතැම් පාඨයන් ආශ්‍රයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශයන් කාණ්ඩයක් ඉදිරිපත් කරනු ලැබේ. ඉන් එකක් එම පාඨයේ අන්තර්ගත කරුණුවලට වඩාත් හොඳින්ම ගැළපෙනු ඇත. ඉතාමත්ම උචිත පාඨය තෝරා දක්වන ලෙස අපේක්ෂකයාට නියම කරනු ලැබේ. අනිකුත් පාඨයන් අළලා ප්‍රශ්න පිළියෙල කරනු ලබන්නේ අපේක්ෂකයා එම පාඨවල අර්ථය වටහා ගන්නා අන්දම පරීක්ෂා කිරීම සඳහාය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

විෂයය අංක 02 - විෂයානුබද්ධ අධ්‍යයනය

අපේක්ෂකයෙකු සතු නිර්මාණාත්මකව සිතීමේ ශක්තීන් සහ ගැටළු නිරාකරණය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම අරමුණු කොට ගෙන සම්පාදිත ප්‍රශ්න පත්‍රයකි. මෙම ප්‍රශ්න පත්‍රයට වර්තමාන ශ්‍රී ලංකාවේ ආර්ථික හා ක්‍රමසම්පාදන සම්බන්ධ තොරතුරු ආශ්‍රිත ග්‍රන්ථ හා ප්‍රකාශන පදනම් කොට ඉස්මතුවන ගැටළු අවස්ථා එකක් හෝ කිහිපයක් අපේක්ෂකයා වෙත ඉදිරිපත් කර ඒවාට විසඳුම් දක්වන ලෙස නියම කරනු ලැබේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

විෂයය අංක 03 - ක්‍රමසම්පාදනය

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අරමුණ වන්නේ ක්‍රමසම්පාදන මූලධර්ම සහ ක්‍රමසම්පාදන උපක්‍රම පිළිබඳව අපේක්ෂකයන්ගේ මූලික දැනුම පිරික්සීම.

**සටහන :**

(I) අපේක්ෂකයින් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂාවකින් පමණි,
(II) අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ,
(III) සෑම අපේක්ෂකයෙකුම ප්‍රධාන ප්‍රශ්න පත්‍ර තුන (03) ට ම පෙනී සිටිය යුතුය.
(IV) වරක දී බඳවා ගනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

09-854

---

**කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

**මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ මිනුම් විද්‍යා පරීක්ෂණ නිලධාරි (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා වන බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017**

Open Competitive Examination for the Recruitment to the Posts of Metrology Experimental Officers (Departmental) of Department of Measurement Units Standards and Services -2017

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ III ශ්‍රේණිය මිනුම් විද්‍යා පරීක්ෂණ නිලධාරි (දෙපාර්තමේන්තුගත) තනතුරු සඳහා බඳවා ගැනීමට 2018 ජනවාරි මාසයේදී පැවැත්වීමට නියමිත තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ අයදුම් පත්‍ර 2017 නොවැම්බර් මස 09 වන දින හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ"යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහල කෙළවරේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ මිනුම් විද්‍යා පරීක්ෂණ නිලධාරි(දෙපාර්තමේන්තුගත) තනතුර යන්න සඳහන් කළ යුතුය.

01. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :
   (i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

   (ii) රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුළදී ලබාගත යුතුය.

02. වැටුප් හා දීමනා :
තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය :
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 යටතේ MN 4-2016 රු.31,490 -10x445 -11 x 660 -10x 730 - 05 x 750 -රු. 54,250.00 වන අතර එම වැටුප හිමිවන්නේ 2020.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

තනතුරෙහි III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර 1 වන කාර්යක්ෂමතා කඩඉම ද, II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගත වීමට පෙර 2 වන කාර්යක්ෂමතා කඩඉම ද, I ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) ක් ගත වීමට පෙර 3 වන කාර්යක්ෂමතා කඩඉම ද සමත් විය යුතු ය.

03. අධ්‍යාපනික සුදුසුකම් :
පිළිගත් විශ්වවිද්‍යාලයකින් භෞතික විද්‍යාව විෂය අවම වශයෙන් වසර 2 ක් හදාරා ඇති විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

04. වෙනත් සුදුසුකම් :
   (i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.
   (ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 - 35 ත් අතර විය යුතුය. (ඒ අනුව 1996.09.25 දින හෝ ඊට පෙර හා 1982.09.25 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)
   (iii) විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් හෙබි අයෙකු විය යුතුය.

05. බඳවා ගැනීමේ ක්‍රමය :
ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලිඛිත විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන අතර, විභාගයේ සාමාර්ථය ලැබීම සඳහා එක් එක් විෂයයට 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රතිශතයක් ලබාගත යුතුය. විෂයයන් සියල්ලම සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු සංඛ්‍යාවේ කුසලතා අනුපිළිවෙල අනුව පිරවීමට නියමිත පුරප්පාඩු ගණන මෙන් දෙගුණයක උපරිමයක් දක්වා අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද ආයතනයක් මගින් පවත්වනු ලබන අතර, උපරිම ලකුණු 25 දක්වා ලබාගත හැක. ලිඛිත විභාගයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ මුළු ලකුණුවල එකතුවෙහි කුසලතා අනු පිළිවෙල අනුව බඳවා ගැනීම සිදු කරනු ලබන අතර අදාළ ප්‍රතිඵල ලේඛනය අධ්‍යක්ෂ, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව වෙත ලබා දීමෙන් අනතුරුව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ලැබේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

06. මෙම විභාගය පහත සඳහන් නගරවලදී පවත්වනු ඇත. අයදුම්කරුවන් තමන් පදිංචි ලිපිනයට ආසන්නතම නගර තම විභාග මධ්‍යස්ථානය ලෙස තෝරා ගත යුතුය. විභාගයට පෙනී සිටින නගරය හා නගර අංකය පහත සඳහන් වගුවට අනුව අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතුය. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මාතලේ | 04 |
| මහනුවර | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| මුලතිව් | 12 |

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| වවුනියාව | 13 |
| ත්‍රිකුණාමලය | 14 |
| මඩකළපුව | 15 |
| අම්පාර | 16 |
| පුත්තලම | 17 |
| කුරුණෑගල | 18 |
| අනුරාධපුරය | 19 |
| පොළොන්නරුව | 20 |
| බදුල්ල | 21 |
| මොණරාගල | 22 |
| කෑගල්ල | 23 |
| රත්නපුර | 24 |
| කිළිනොච්චිය | 25 |

කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති නම් එම අයදුම්කරුවන් ආසන්න වෙනත් නගරයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

07. **ලිඛිත විභාගය :**
විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට ඉල්ලුම් කළ මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය.

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.
01. *බුද්ධි පරීක්ෂණය* - මුළු ලකුණු 100 යි. කාලය පැය 1 කි.

අපේක්ෂකයාගේ තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය සහ තීරණ ගැනීමේ හැකියාව වැනි කරුණු නිශ්චය කිරීම සඳහා සකස් කරනු ලබන මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වනු ඇත. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

02. *සාමාන්‍ය දැනීම* - මුළු ලකුණු 100 යි. කාලය පැය 1 කි.

ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද, ජාතික හා අන්තර් ජාතික වශයෙන් වැදගත් වන නූතන කරුණු ද, ජාතික හා ජාත්‍යන්තර විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් ඇති අවබෝධය ද පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වනු ඇත. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය (උපරිම ලකුණු 25).
පරිගණක හැකියාව, ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය, සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය සඳහා උපරිම ලකුණු 25 දක්වා හිමිවේ.

08. *අයදුම් පත්‍ර හා අයදුම් කරන ආකාරය :*

අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 09 දක්වා පළමුවන පිටුවට ද, 10 සිට 16 දක්වා දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු ඇතුළත් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබැවින් අයදුම් පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කර අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා ඇත් ද යන්න පිළිබඳවත් විමසිලිමත් වන්න. අදාළ අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම අයදුම්කරුට ප්‍රයෝජනවත් විය හැක. තව ද අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රයේ සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.අයදුම්පත්‍ර ලැබුණු බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ.

09. රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ/ රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුතු නිළධාරීන්ගේ අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

10. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, නියමිත විභාග ගාස්තු ගෙවා,නියමිත දිනට හෝ එදිනට පෙර අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත්

අයදුම් පත්‍රයේ පිටපත ද, විභාග ගාස්තු ගෙවීමේදී ලද කුවිතාන්සියේ පිටපත ද, අයදුම්පත්‍රය තැපෑලෙන් යොමු කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම්, ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීමට ඔබගේ ෆැක්ස් අංකයක් ද සමග ඉහත ඔබගේ විස්තර ඇතුළත් ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින් විමසා සිටීමද වඩාත් ප්‍රතිඵලදායී වනු ඇත.

10.1. අයදුම්පත්‍රයේ ද, විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය.කිසියම් ආයතනයකින් විභාගයට අයදුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු,සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු,නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රු.240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

විභාග ගාස්තුව රු.600.00 ක් වන අතර, මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක්, උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බවද කාරුණිකව දන්වමි. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරන අතර, ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාග ැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

11. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී අයදුම්කරුවන්ගේ අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණි. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

12. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කරුණක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ සතුවන අතර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් වේ නම්, එවැනි විටෙක සිංහල නිවේදනය බලාත්මක වේ.

එස්. එන්. අකුරන්තිලක,
මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ(රා.ඉ).

2017 සැප්තැම්බර් මස 29 වැනි දින,
මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව,
මාහේනවත්ත,
පිටිපන,
හෝමාගම.

**ආදර්ශ අයදුම් පත්‍ර ආකෘතිය**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා [ ]

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ
මිනුම් විද්‍යා පරීක්ෂණ නිලධාරී (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා වන බඳවා ගැනීමේ
විවෘත තරග විභාගය - 2017

Open Competitive Examination for the Recruitment to the Posts of Metrology Experimental Officers (Departmental) of Department of Measurement Units, Standards and Services -2017

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල -2
දෙමළ -3
ඉංග්‍රීසි- 4
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය හා නගර අංකය

නගරය [ ] නගර අංකය [ ]

(විභාග නිවේදනයේ 06 වන ඡේදයට අනුව)

1. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරින්
   උදාහරණ NIMAL, A.B.C.D :————.
2. මුලකුරු වලින් හැඳින්වෙන නම් ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.
3. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
4. ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.):————.
5. ස්ත්‍රී /පුරුෂ භාවය (පුරුෂ - 0,ස්ත්‍රී - 1)
   අදාළ අංකය කොටුව තුල ලියන්න. [ ]
6. ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | | | ]
7. විවාහක/අවිවාහක බව (විවාහක -1,අවිවාහක -2)
   අදාළ අංකය කොටුව තුල ලියන්න. [ ]
8. ජන වර්ගය (සිංහල-1,දෙමළ-2,ඉන්දියානු දෙමළ-3,මුස්ලිම්-4,වෙනත්-5). [ ]
   අදාළ අංකය කොටුව තුළ ලියන්න
9. (අ) උපන් දිනය

   වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

   (ආ) අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට වයස (2017 නොවැම්බර් මස 09 වන දිනට)

   අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි කිරීමෙන් ද යන්න සඳහන් කරන්න.(ලියාපදිංචි කිරීමෙන් නම් විස්තර සපයන්න) :————.
11. අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම්

11.1 උපාධිය :————.
විශ්වවිද්‍යාලය :————.
බාහිර/අභ්‍යන්තර :————.
උපාධිය වලංගු දිනය :————.
විෂයයන් :————.
පන්ති සාමාර්ථ :————.
විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.

11.2

| ඔබ සමත් වී ඇති ඉහළම විභාගය | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

11.3 වෙනත් අධ්‍යාපනික /වෘත්තීය සුදුසුකම්

| *විභාගය/පාඨමාලාව* | *දිනය/කාලසීමාව* | *ආයතනය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

12. වර්තමාන රැකියාව සහ ඉහත දී යම් පත්වීමක් දැරුවේ නම්.

| *ආයතනය* | *තනතුර* | *සිට* | *දක්වා* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

13. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කර තිබේ ද? (එසේනම් විස්තර සපයන්න.) :————.

14. ඔබට විරුද්ධව (දැනටමත් රජයේ සේවයේ නියුක්ත නම්)දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කර තිබේ ද? :————.

15. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියකින් වරදකරු වී තිබේ ද? :————.
16. (i) විභාග ගාස්තුව ගෙවූ තැපැල් /උප තැපැල් කාර්යාලය :————.
(ii) කුවිතාන්සියේ අංකය :————.
(iii) දිනය :————.
(iv) ගෙවූ මුදල :————.

විභාග ගාස්තුව ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක)

17. අයදුම්කරුගේ සහතිකය

මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසය පරිදි, සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ...................... හා .............................. වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි.එසේම විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

18. අයදුම්කරු රජයේ සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව :-

ඉහත දී ඇති විස්තර නිවැරදි බවත් /පහත සඳහන් පරිදි සංශෝධනය වියයුතු බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා, එම ලදුපත අලවා ඇති බවත්,ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම........................... බවත් මම සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදා හැරිය හැකිය/නොහැකිය.

(අදාළ නොවන වචන කපා හරින්න)

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

තනතුර :————.
(නිල මුද්‍රාව මගින් සනාථ කළ යුතුය)

දිනය :————.

09-890

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

**මිල ගණන් කැඳවීමයි**

**ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2018**

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට මිල ගණන් 2017.11.20 වැනි දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාරගනු ලැබේ. එදිනම ප. ව. 2.05 ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *මිල ගණන් භාර ගැනීම* | *ආසන්න නගරය* | *නිවස අවශ්‍ය දිනය* |
|---|---|---|---|---|---|
| බස්නාහිර පළාත | කළුතර | හොරණ | පළාත් සර්වේයර් ජනරාල් (බස්නාහිර පළාත) පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, කිරුල පාර, නාරාහේන්පිට, කොළඹ 05 | හොරණ අවට | 2018.01.01 |
| | කළුතර | කළුතර | එම | කළුතර අවට | 2018.01.01 |
| සබරගමුව පළාත | රත්නපුර | කලවාන | පළාත් සර්වේයර් ජනරාල් (සබරගමුව පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, නව නගරය, රත්නපුර. | කලවාන අවට | 2018.01.01 |
| | රත්නපුර | පැල්මඩුල්ල | එම | පැල්මඩුල්ල අවට | 2018.01.01 |
| | කෑගල්ල | කෑගල්ල | එම | කෑගල්ල අවට | 2018.01.01 |
| | කෑගල්ල | ගලිගමුව | එම | ගලිගමුව අවට | 2018.01.01 |
| | කෑගල්ල | රුවන්වැල්ල | එම | රුවන්වැල්ල අවට | 2018.01.01 |
| දකුණු පළාත | හම්බන්තොට | තිස්සමහා-රාමය | පළාත් සර්වේයර් ජනරාල් (දකුණු පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, ගාල්ල | තිස්සමහාරාම අවට | 2018.01.01 |

සපුරාලිය යුතු පොදු අවශ්‍යතා :

සෑම ගොඩනැගිල්ලක්ම ආරක්ෂිත වැටකින් හෝ තාප්පයකින් ආරක්ෂා වී තිබිය යුතු ය. ජල නළ පහසුකම් තිබිය යුතු අතර, අපද්‍රව්‍ය හෝ ජලය ඉවත් කිරීමේ ක්‍රමවත් පද්ධතියක් තිබිය යුතු ය. ජල හා විදුලි මීටර් වෙන වෙන ම තිබිය යුතු ය. යාබදව අධික ශබ්ද නැගෙන කර්මාන්තශාලා හෝ එවැනි වෙනත් දෑ නොතිබිය යුතු ය. ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයට යාබදව නොවේ නම් ඒ සඳහා ක්‍රමවත් පිවිසුම් මාර්ගයක් තිබිය යුතු ය.

පහත දක්වා ඇති ආකෘතියට අනුව සකසන ලද ඉල්ලුම් පත්‍ර, සපුරාලිය යුතු පොදු අවශ්‍යතා විස්තර ද, සහිතව, ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙහි " ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම (අදාළස්ථාන නාමය)" යනුවෙන් සඳහන් කර, 2017.11.20 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකි ය.

පී. එම්. පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්.

2017 සැප්තැම්බර් මස 11 වැනි දින,
කොළඹ 05, කිරුල පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2018

**මිල ගණන් කැඳවීමේ ඉල්ලුම්පත්‍රය - 2018**

ගොඩනැගිලි අයිතිකරුගේ -

1. සම්පූර්ණ නම : ____________.
2. ලිපිනය : ____________.
3. දුරකථන අංකය : ____________.
4. ජාතික හැඳුනුම්පත් අංකය : ____________.

ගොඩනැගිල්ල -

1. කුලියට දෙනු ලබන්නේ කුමන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ද? : ____________.
2. මාසික කුලී මුදල : ____________.
3. පිහිටි ස්ථානයේ ලිපිනය : ____________.
4. අදාළ නගරයේ සිට පිහිටි ස්ථානයට ඇති දුර ප්‍රමාණය කි. මී. : ____________.
5. භූමියේ විශාලත්වය : ____________.
6. ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය හා කාමර ගණන ආදිය පිළිබඳව විස්තර: ____________.
7. වෙනම කියවිය හැකි ජල මීටර් තිබේ ද? : ____________.
8. වෙනම කියවිය හැකි විදුලි මීටර් තිබේ ද? : ____________.
9. ආරක්ෂිත මායිම් විස්තර සපයන්න (තාප්පය/කම්බි වැට/...........................) : ____________.
10. නවතා තැබීමට හැකි වාහන ගණන : ____________.

ඉහත තොරතුරු සත්‍ය බවත් යම් තොරතුරක් අසත්‍ය බව හෙළිවුවහොත් මවිසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සර්වේයර් ජනරාල් ප්‍රතික්ෂේප කරනු ලබන බව මම දන්නා බවත් මෙයින් පිළිගනිමි.

____________,
අයදුම්කරුගේ අත්සන.

09-684

---

# බඩු බාහිරාදිය විකිණීම්

**මහාධිකරණය - කල්මුණේ**

කල්මුණ මහාධිකරණ නඩු විභාගවලදී අත්පත් කර රාජසන්තක කරන ලද පහත සඳහන් භාණ්ඩ 2017.10.24 වැනි දින ප. ව. 2.30 ට කල්මුණ මහාධිකරණ පරිශ්‍රයේ දී ප්‍රසිද්ධියේ වෙන්දේසි කිරීමට නියමිතය.

මහාධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ පෙර අවසරය සහිතව එදින ප. ව. 12.30 සිට ප. ව. 2.00 දක්වා අතර කාලය තුළ මෙම භාණ්ඩ පරීක්ෂා කිරීමට හැකියාව ඇත. මෙම භාණ්ඩවල මිල තක්සේරු කරන ලද වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කළහොත් මෙම භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ඉවත් කර අධිකරණ භාරයට ගැනීමට හිමිකම් ඇත.

මෙම භාණ්ඩ වෙන්දේසියේ දී ලබා ගන්නා අය ඒ සඳහා මුදල වහාම මෙම අධිකරණයට ගෙවා රිසිට්පත් ලබා ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ වහාම අධිකරණ පරිශ්‍රයෙන් ඉවත් කිරීමට පියවර ගත යුතු ය. මෙහිදී චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාර ගනු නොලැබේ.

වෙන්දේසි කිරීම පිළිබඳව කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් වෙන්දේසිය සිදු කරන අවස්ථාවේ දීම ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

වෙන්දේසියට සහභාගි වීමට කැමති අය සිය ජාතික හැඳුනුම්පත සමග පැමිණිය යුතුය.

**ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ඇති භාණ්ඩ විස්තර**

| | නඩු අංකය | | භාණ්ඩ |
|---|---|---|---|
| (i) | HC/KAL/279/2013 | | EP/UL/0728 (Hero Honda Splender) යතුරු පැදි 01 |
| (ii) | HC/KAL/294/2014 | (i) | LD -1511 අංක දරන 18.5A මෝටර් සවි කරන ලද කොළ පැහැති ඇඹරුම් යන්ත්‍ර 01 |
| | | (ii) | 50910150 අංක දරන මෝටර් 01 |
| | | (iii) | කොළ පැහැති ඇඹරුම් යන්ත්‍ර 01 |
| | | (iv) | කොළ පැහැති කුඩා ඇඹරුම් යන්ත්‍ර 01 |

නවරත්න මාරසිංහ,
මහාධිකරණ විනිසුරු,
(අපරාධ හා සිවිල් අභියාචනා)
නැගෙනහිර පළාත් බද මහාධිකරණය,
කල්මුණේ.

2017 සැප්තැම්බර් මස 08 වැනි දින.

09-683

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - නුවරඑළිය**

අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු රාජසන්තක කරන ලද හිමිකම් නොපෑ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නුවරඑළිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2017.10.14 වැනි සෙනසුරාදා පෙ.ව. 9.30ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ.

02. මෙහි පහත භාණ්ඩවලට හිමිකම් පාන්නකු වේනම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් අධිකරණ රෙජිස්ට්‍රාර්වරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර් වරියගේ අවසරය ඇතුව වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් එවලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. චෙක්පත් ආදිය භාරගනු නොලබන අතර, සියලුම ගෙවීම් මුදලින් පමණක් ගෙවිය යුතුය.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගන්නා ගැණුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

ඉන්දික රුවන් ද සිල්වා,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
නුවරඑළිය.

2017 සැප්තැම්බර් මස 11 වැනි දින,
නුවරඑළිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**නුවරඑළිය මහාධිකරණය**

වෙන්දේසියට නියමිත නඩු භාණ්ඩ 2017

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 1 | HC/NE/23/13 | කවාතු පිහි | 1 |
| 2 | HC/NE/50/12 | කවාතු පිහි | 1 |
| 3 | HC/NE/67/09 | කවාතු පිහි | 1 |
| | | පොරොව | 1 |
| | | කෙටේරිය | 1 |
| 4 | HC/NE/61/13 | කවාතු පිහි | 1 |
| 5 | HC/NE/121/10 | කවාතු පිහි | 2 |
| | | මේස පිහි | 1 |
| 6 | HC/NE/17/09 | කවාතු පිහි | 1 |
| 7 | HC/NE/129/10 | මේස පිහි | 1 |
| 8 | HC/NE/33/09 | මේස පිහි | 3 |
| 9 | HC/NE/34/12 | මේස පිහි | 1 |
| | | විදුලි පන්දම | 1 |
| | | දුනුකොල | 1 |
| 10 | HC/NE/20/13 | කවාතු පිහි | 1 |
| 11 | HC/NE/222/10 | පොරොව | 1 |
| 12 | HC/NE/114/09 | විදුලි පන්දම් | 1 |
| 13 | HC/NE/16/12 | විදුලි වැසුම් (හෙල්මට්) | 1 |
| 14 | HC/NE/113/09 | ඔරලෝසු | 1 |
| | | කුඩ | 1 |
| 15 | HC/NE/01/15 | පිහි | 1 |

**නුවරඑළිය මහෙස්ත්‍රාත් අධිකරණය**

වෙන්දේසියට අදාළ භාණ්ඩ විස්තරය

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 1 | 72177 | කරඩි | 2 |
| | | පොම්ප | 1 |
| 2 | අංක රහිත | පිහි | 8 |
| 3 | අංක රහිත | උදලු | 3 |
| 4 | අංක රහිත | අලවංගු | 2 |
| 5 | අංක රහිත | මුට්ටි | 2 |
| 6 | අංක රහිත | සවල් | 1 |

**නුවරඑළිය මහෙස්ත්‍රාත් අධිකරණය**

භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කර ලද භාණ්ඩ

| *අනු. අංකය* | *භාණ්ඩ විස්තරය* | | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 1 | අල්මාරි | | 1 |
| 2 | ටීපෝ | | 1 |
| 3 | පරිගණක යූ පී එස් LC/05/4713 | | 1 |
| 4 | ෆැක්ස් යන්ත්‍ර | MC/OF/021/01 | 1 |
| | | MC/OF/021/02 | 1 |
| | | MC/OF/021/03 | 1 |
| | | MC/OF/021/04 | 1 |
| 5 | යතුරුලියන | 221279 | 1 |
| | | 1111473 | 1 |
| | | 965093 | 1 |
| | | 9078374 | 1 |
| | | 665208 | 1 |
| | | 166853 | 1 |
| | | 665147 | 1 |
| | | 964772 | 1 |
| 6 | පරිගණක සී පී යූ | LC/05/5118 | 1 |
| | | LC/05/5115 | 1 |
| 7 | පරිගණක මොනිටර් | 750543000030 | |
| | | 750543000057 | 1 |
| | | 750543000101 | 1 |
| | | 750543000014 | 1 |
| 8 | දිරාපත් වූ යකඩ කැබලි | | |

**නුවරඑළිය දිසා අධිකරණය**

භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කර ලද භාණ්ඩ

| *අනු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 1 | අක්‍රීය වතුර මෝටර් | 1 |
| 2 | අක්‍රීය කාමර තාපක | 1 |

**නුවරඑළිය දිසා අධිකරණ ගරු දිසා විනිසුරුතුමියගේ හා නුවරඑළිය ගරු මහෙස්ත්‍රාත්තුමාගේ නිල රථවලින් ඉවත් කරන ලද ටයර්**

| *අනු. අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 1 | BRIDGESTONE/B/700 14" ටයර් | 4 |
| 2 | PIRELLI R185/60/15 ටයර් | 2 |

09-825

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - මතුගම**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ
ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. මතුගම මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද සහ නඩු අංක සොයාගත නොහැකි පහත සඳහන් භාණ්ඩ වර්ෂ 2017.10.15 වැනි දින පෙ.ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙම වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නකු වේ නම් ඒ පිළිබඳ වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 9.00 සිට පෙරවරු 10.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 ට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු අතර සියළුම ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතුය. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන අය තම ජාතික හැඳුනුම්පතද ඉදිරිපත් කළ යුතුය.

06. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේනම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

කෝසල සේනාධීර,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
මතුගම.

2017 සැප්තැම්බර් මස 15 වැනි දින,
මතුගම මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**මතුගම මහෙස්ත්‍රාත් අධිකරණ වෙන්දේසි ලේඛනය - 2017**

| | *නඩු අංකය* | *භාණ්ඩ වර්ගය / භාණ්ඩ වර්ග* |
|---|---|---|
| 1 | 75245 | වතුර මෝටර් 01 |
| 2 | 13934 | රබර් සෙරප්පු 02 |
| 3 | 25920 | බැටරි 01 |
| 4 | 15291 | බැට්‍රි 01 |
| 5 | 25921 | බැටරි 01 |
| 6 | 25917 | බැටරි 01 |
| 7 | 25918 | බැටරි 01 |
| 8 | 14450 | කුඩා ටෙලිකොම් වයර් කැබලි 3ක් |
| 9 | 4275 | මන්න පිහි 01 |
| 10 | 13427 | කුඩා ටෙලිකොම් වයර් කැබලි 2 |
| 11 | 9274 | කොන්ක්‍රීට් ලෑල්ලක් |
| 12 | 7061/14 | ඩීසල් කෑන් 02 |
| 13 | 25919 | බැටරි 01 |
| 14 | 71641 | මන්න පිහි 1 |
| 15 | 84561 | යකඩ බට කැබලි 2 |
| 16 | 29563 | පොරව 01 |
| 17 | 23577 | බැට්‍රි 1 |
| 18 | 76687 | ටයර් 2 |
| 19 | 26453 | කළු පාට බෑගයක් |
| 20 | 23866 | නිල් පාට ගෑස් 01 |
| 21 | 32360 | ඔට්ටපාලු සහිත කළු කවරය |
| 22 | 35343 | ස්කුරුප්පු නියන් 01 |
| 23 | 83797 | රබර් ෂීට් 23 |
| 24 | 75839 | ටීවී එකයි |
| 25 | 3182 | නිල් පාට ගෑස් 01 |
| 26 | 50778 | අලවංගු 1 |
| 27 | 59517 | කැඩී ගිය ජංගම දුරකථනයක් |
| 28 | බීආර්1061/09 | පොරව 1 (70883) |

| | නඩු අංකය | භාණ්ඩ වර්ගය / භාණ්ඩ වර්ග | |
|---|---|---|---|
| 29 | 94603 | යකඩ බට කැබැල්ලක් | |
| 30 | 23926 | හොට් ප්ලේට් 1 | |
| 31 | 60525 | නිල් කමිසයක්, මීයන් කා ඇති අළු කමිසයක්, ඩෙනිම් කලිසම් 1 සහිත කවරය | |
| 32 | 52001/09 | කිලෝ 500 පමණ යකඩ තොගය (1671/09) | |
| 33 | 13073 | යකඩ ගේට්ටුවක කොටසක් | |
| 34 | 73354 | දුනු කොල 2 | |
| 35 | 31084 | ඇලුමිනියම් කොටස් කිහිපයක් | |
| 36 | 96199 | තාර බැරලය | |
| 37 | 23463 | කොළ පාට බැටරි 1 | |
| 38 | 35031 | ගෑස් ලිප් 01, ජෝගුවක් | |
| 39 | 35031 | ගෑස් 01 (කෑනය එළියේ ඇත) | |
| 40 | 18846 | වාහනයක බැටරි 01 | |
| 41 | 85217 | ඔට්ටපාළු කවරයක් | |
| 42 | 76336 | බෙඩ් ෂීට් 3, සරොම් 1, ෂර්ට් 1 සහිත කවරය | |
| 43 | 78964 | රබර් රොටි කිහිපයක් සහිත කවරය | |
| 44 | 36312 | ඩීසල් කෑන් 04 (බීආර්1269/06) | |
| 45 | 25010/07 | පා පැදි 01 | |
| 46 | 840/06 | පා පැදි 01 | |
| 47 | 28569/08 | පා පැදි 01 | |
| 48 | 514/07 | පා පැදි 01 | |
| 49 | 3908/08 | පා පැදි 01 | |
| 50 | 98405 | සුදු පැහැ සැම්සුන්ග් ජංගම දුරකථනයක් | |
| 51 | 37951 | කහපාට ගෑස් සිලින්ඩර් 01 | |
| 52 | 37951 | කරාම 03 ගෑස් බර්නර් 01 | |
| 53 | බීආර්1269/06 | ඩීසල් සහිත කෑන් 05 (36313/06) | |
| 54 | 1436/13 | වාහන බැටරි 04 | |
| 55 | 37989 | කහපාට ගෑස් සිලින්ඩර් 01 | |
| 56 | 37989 | කරාම 04 ගෑස් බර්නර් 01 | |
| 57 | 38000 | කහපාට ගෑස් සිලින්ඩර් 01 | |
| 58 | 38000 | කරාම 04 ගෑස් බර්නර් 01 | |
| 59 | 38011 | නිල් පාට ගෑස් සිලින්ඩර් 01 | |
| 60 | 38011 | කරාම 04 ගෑස් බර්නර් 01 | |
| 61 | 15383 | පා පැදියක් | |
| 62 | 71163 | රබර් කිහිපයක් (71163) | |
| 63 | 18294 | තඹ කම්බි සහිත කවරය | |
| 64 | 13429 | කැලකියුලේටර් 1, ටෝච් 1 | |
| 65 | 4814 | රබර් රොටි සහිත කවර 01 | |
| 66 | 37859 | ජංගම දුරකථන 01 සහිත ලිපි කවරය | |
| 67 | බීආර්1811/05 | වක් පිහි 1 (11204) | |
| 68 | 73606 | කුඩා අලවංගු 1 | |
| 69 | 48808 | COSMO වර්ගයේ TV1 | |
| 70 | 64264 | ගිනිගල් 01 ක් | |
| 71 | 74108 | වාහන බැට්‍රියක් | |
| 72 | 60619 | සවල් 1 | |
| 73 | 54537 | ස්කුරුප්පු නියන් 1 | |
| 74 | 1097/09 | යකඩ පොලු 1, කැති 1 | |
| 75 | බීආර් 888/05 | කැති 1 | |
| 76 | 12621 | පිහි 02 | |
| 77 | 39204 | කුළුගෙඩියක් , බෝළ කටුවක් | |
| 78 | 97327 | පාසැල් බෑගයක්, තැඹිලි පාට ඉටිකවරයක් | |
| 79 | බීආර්37/08 | වක් පිහියක් (32540) | |
| 80 | 228/08 | ජංගම දුරකථනයක් (27208) | |
| 81 | 834/13 | සවල් 2 | |
| 82 | 3862 | පිහියක් | |
| 83 | 2368 | ඇළුමිනියම් වලඳක් | |
| 84 | 4191 | අත්පොරව 1 | |
| 85 | 2370 | උදළු තල 1 | |
| 86 | 2372 | ඇතිලි 1 | |
| 87 | 7341 | මන්න පිහියක් | |
| 88 | 39456 | ගෑස් 01, ලිප් 01 | |
| 89 | 87923 | ලෑලි කැබලි කිහිපයක් | |
| 90 | 39695 | ගෑස් සිලින්ඩර් 01 | |
| 91 | 39695 | ගෑස් ලිපි 01 | |
| 92 | 26450 | වැල් තොගය | |
| 93 | 63026 | උදළු තල 1 | |
| 94 | 61228 | පොරවක් | |
| 95 | බීආර්1082/08 | පිහි 1 (53674) | |
| 96 | 13490 | ජංගම දුරකථන 4 ක් | |
| 97 | 39882 | ගෑස් 01, ලිප් 01 | |
| 98 | 72577 | කොන්ක්‍රීට් කම්බි කණු 04 | |
| 99 | 69150 | ඔලිම්පස් කැමරාවක් (269/04) | |
| 100 | 81731 | පොරව 1 | |
| 101 | 73879 | මේස පිහියක් | |
| 102 | 70753 | සවල් 1 | |
| 103 | 86154 | මන්නයක් | |
| 104 | 40526 | ගෑස් 01 | |
| 105 | 62470 | වක් පිහි 01 | |
| 106 | 62470 | ජංගම දුරකථනයක් | |
| 107 | 23271 | පිහියක් | |
| 108 | 29457 | අලවංගු 1 | |
| 109 | 29457 | පොරව 1 | |
| 110 | 25726 | වාහන බැට්‍රි 02යි | |
| 111 | 25782 | ටෙලිකොම් වයර් කැබලි කිහිපයක් | |
| 112 | 9776 | ස්කුරුප්පු නියන් 1 | |
| 113 | 95522 | බයිසිකල් ලැගිජ් 1 (පාපැදියක) | |
| 114 | 50788 | වතුර මෝටර් 01 | |
| 115 | 16239 | රබර්ෂීට් 3 ක් සහ ඔට්ටපාළු පෝර කවරය | |
| 116 | 94151 | කෑන් 1 | |
| 117 | අංක රහිත | 110-0282 යතුරුපැදිය | අබලි |
| 118 | අංක රහිත | ඩයිඩෝ වර්ගයේ දිරාගිය යතුරුපැදිය | අබලි |
| 119 | අංක රහිත | අංක රහිත යමහා වර්ගයේ දිරා ගිය යතුරු පැදියක කොටස් | අබලි |
| 120 | 30526 | දිරා ගිය අත් ට්‍රැක්ටර් ටේලර කොටසක් | අබලි |
| 121 | අංක රහිත | 78 - 7999 දරන අත් ට්‍රැක්ටර් ඉදිරි කොටස | අබලි |
| 122 | 84028 | අත් ට්‍රැක්ටරය SB – 8028 | අබලි |
| 123 | අංක රහිත | අංක රහිත අත් ට්‍රැක්ටර් ඉදිරි කොටස | අබලි |
| 124 | 30526 | අංක රහිත අත් ට්‍රැක්ටර් ඉදිරි කොටස | අබලි |
| 125 | අංක රහිත | අංක රහිත අත් ට්‍රැක්ටර් ඉදිරි කොටස | අබලි |
| 126 | අංක රහිත | 36-1037 දරන ලොකු ට්‍රැක්ටර් ඉදිරිපස කොටස | අබලි |
| 127 | 26450 | 38 ශ්‍රී 6188 ඩෙලිකා වෑන් රථය | අබලි |
| 128 | 64118 | පිළිස්සීගිය යතුරුපැදි කොටස් 1 | අබලි |
| 129 | 17635 | 137-2136 දිරාගිය යමහ මේට් වර්ගයේ යතුරු පැදිය | අබලි |
| 130 | 5532 | WP GX – 2153 ව්‍යාජ අංක තහඩු යෙදූ බජාජ් යතුරුපැදිය | අබලි |
| 131 | 62593 | 122 - 3220 යමහ මේට් වර්ගයේ කොළ පැහැ යතුරුපැදිය | අබලි |
| 132 | 82852 | GG 2064 STAR WAY වර්ගයේ නිල්පැහැ යතුරු පැදිය | අබලි |
| 133 | 85283 | 149 - 0588 හීරෝ හොන්ඩා රතු පැහැ යතුරු පැදිය | අබලි |
| 134 | 11652 | 132 – 5251 MD90 වර්ගයේ යතුරු පැදියක් | අබලි |
| 135 | 71948 | පිළිස්සීගිය යතුරුපැදි කොටස් 1 | අබලි |
| 136 | 25882 | WP VK – 6081 බජාජ් වර්ගයේ යතුරු පැදිය | කලි.ප. කළ හැ |
| 137 | අංක රහිත | 82ශ්‍රී117 හොන්ඩා ටුවින් වර්ගයේ යතුරු පැදියක් | අබලි |
| 138 | අංක රහිත | 89ශ්‍රී1265 හොන්ඩා ටුවින් වර්ගයේ යතුරු පැදිය | අබලි |
| 139 | අංක රහිත | TZ – 9296 බජාජ් CT100 රතු යතුරුපැදියක් | ලි.ප. කළ හැක |
| 140 | අංක රහිත | දිරා ගිය නිල් පැහැ ලොරියක් (28ශ්‍රී6955) | අබලි |
| 141 | 92164 | HV – 5687 දිරා ගිය රතු ත්‍රී රෝද රථය | අබලි |
| 142 | 53916 | SC QH – 8588 ත්‍රී රෝද රථය | අබලි |
| 143 | අංක රහිත | අංක රහිත යතුරු පැදි 01 | අබලි |
| 144 | අංක රහිත | ත්‍රී රෝද රථ වැසි කැබලි 02 | අබලි |
| 145 | 66145 | 41ශ්‍රී1261 කැන්ටර් වර්ගයේ ලොරි රථය | අබලි |
| 146 | AR2164/16 | අංකයක් සඳහන් නොවන කහපාට චැලි වර්ගයේ යතුරුපැදිය | අබලි |
| 147 | AR2164/16 | අංක අපැහැදිලි සී.ඩී. 125 ටුවින් වර්ගයේ යතුරුපැදිය | අබලි |
| 148 | AR2164/16 | අංකය අපැහැදිලි හර්කියුලිස් JX90 වර්ගයේ යතුරුපැදිය | අබලි |
| 149 | AR2164/16 | අංකය අපැහැදිලි වියැන්ජි වර්ගයේ රතු පාට යතුරුපැදිය | අබලි |
| 150 | AR2164/16 | අංකය අපැහැදිලි දිරාගිය බජාජ් වර්ගයේ ත්‍රීරෝද රථය | අබලි |
| 151 | AR2164/16 | අංක අපැහැදිලි ලොන්සිං වර්ගයේ යතුරුපැදිය | අබලි |
| 152 | AR2164/16 | අංකයක් සඳහන් නොවන හව්ජින් වර්ගයේ යතුරුපැදිය | අබලි |
| 153 | 1003/2000 | 148-0919 යතුරු පැදිය | අබලි |
| 154 | අංක රහිත | 204-7296 ත්‍රීරෝද රථය | අබලි |
| 155 | 19233/15 | 116-0627 යතුරුපැදිය | අබලි |
| 156 | AR2186/16 | හොන්ඩා වර්ගයේ කොළ පාට චැලිවර්ගයේ යතුරුපැදිය | අබලි |
| 157 | AR2186/16 | Asia Wina වර්ගයේ යතුරුපැදිය | අබලි |
| 158 | AR2186/16 | හොන්ඩා වර්ගයේ සී.ඩී. තැපැල් 90 යතුරුපැදිය | අබලි |
| 159 | AR2427/16 | 123-6220 දරන යතුරුපැදිය | අබලි |
| 160 | AR2429/16 | 126-0685 දරන යතුරුපැදිය | අබලි |
| 161 | AR2186/16 | හීරෝ හොන්ඩා වර්ගයේ සී.බී. ඉසඩ්. වර්ගයේ යතුරුපැදිය | අබලි |
| 162 | AR2428/16 | 115-3696 දරන යතුරුපැදිය | අබලි |
| 163 | AR2186/16 | සුපර් කප් වර්ගයේ යතුරු පැදිය | අබලි |
| 164 | AR2186/16 | හොන්ඩා එම්. බී. 08 වර්ගයේ යතුරු පැදිය | අබලි |
| 165 | AR2186/16 | සී. ඒ. එල්. වර්ගයේ යතුරුපැදිය | අබලි |
| 166 | AR2186/16 | TVS MAXR 100 වර්ගයේ යතුරු පැදිය | අබලි |
| 167 | AR2186/16 | හොන්ඩා වර්ගයේ රතු පාට ට්‍රේල් යතුරු පැදිය | අබලි |
| 168 | AR2186/16 | හීරෝ හොන්ඩා ටුයින් වර්ගයේ යතුරුපැදි 1 යි | අබලි |
| 169 | AR2186/16 | හීරෝ හොන්ඩා ටුයින් වර්ගයේ යතුරුපැදි 01යි | අබලි |
| 170 | AR2186/16 | හීරෝ හොන්ඩා ටුයින් වර්ගයේ යතුරුපැදි 01 යි. | අබලි |
| 171 | 90837 | 77-0452 දරන අත් ට්‍රැක්ටරය | අබලි |
| 172 | 815/07 | SA – 4456 අත් ට්‍රැක්ටර් සහ ටේලරය | අබලි |
| 173 | 94280 | WP UV-9931 දරන යතුරු පැදිය | ලි.ප.කළ හැක |
| 174 | 31173/08 | 16-6376 ත්‍රී රෝද රථය | අබලි |
| 175 | 21281/06 | අංක රහිත දිරාගිය අත්ට්‍රැක්ටරය | අබලි |
| 176 | 70405/11 | 103-0499 යතුරු පැදිය | අබලි |
| 177 | 7950/06 | 105-5969 දරන යතුරු පැදිය | අබලි |
| 178 | 25268 | ට්‍රැක්ටර් ටේලරය | අබලි |
| 179 | 32691/00 | 24ශ්‍රී6100 දරන ලොරි රථය | අබලි |
| 180 | 65916(944/08) | HU-2312 යතුරු පැදිය | අබලි |
| 181 | 64268 | 138-2957 යතුරුපැදිය | අබලි |
| 182 | 22436 | 22 ශ්‍රී 1213 දිරාපත් වී ඇති කුඩා ලොරි රථය | අබලි |
| 183 | 18319 | 17496 යනුවෙන් සඳහන් අත්ට්‍රැක්ටරය | අබලි |
| 184 | 24349 | ලි. ප. නොකළ සී ෆැන්ඩ් වර්ගයේ අත්ට්‍රැක්ටරය | අබලි |
| 185 | 26882 | 203-4061 දරන ත්‍රී රෝද රථය | අබලි |
| 186 | 37096 | සුකීටෝ වර්ගයේ අත්ට්‍රැක්ටරය | අබලි |
| 187 | 55677 | සීෆැන් වර්ගයේ අත්ට්‍රැක්ටරය | අබලි |
| 188 | 63007 | අංකයක් සඳහන් නැති අත්ට්‍රැක්ටරය | අබලි |
| 189 | 64451 | 77-4688 දරන අත්ට්‍රැක්ටරය | අබලි |

මතුගම මහෙස්ත්‍රාත් අධිකරණ කාර්යාලය තුළ පවතින කැඩී බිඳී ඇති සෑදීමට නොහැකි පහත සඳහන් භාණ්ඩ ද ප්‍රසිද්ධ වෙන්දේසිය සඳහා සූදනම් කොට ඇත -

190
191 epson වර්ගයේ පරිගණක මුද්‍රණ යන්ත්‍ර 01
192 Konika වර්ගයේ ඡායා පිටපත් යන්ත්‍ර 01
193 Lahier වර්ගයේ ඡායා පිටපත් යන්ත්‍ර 01
194 Conon වර්ගයේ ඡායා පිටපත් යන්ත්‍ර 01
195 ෆැක්ස් යන්ත්‍ර 01
196 විදුලි පංකා 02
197 ටයිප් රයිටර් 06
198 ලාච්චු 04 වානේ කබඩ් 03යි
199 ලාච්චු 03, වානේ කබඩ් 02යි
200 විනිශ්ච ආසන 01යි
201 ඇඳි සහිත පුටු 09
202 ඇඳි රහිත පුටු 11
203 යතුරු ලියන මේස 03
204 පරිගණක පුටු 01

09-883

# රජයේ නොවන දැන්වීම්

## ප්‍රසිද්ධ දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ

සමාගමේ නම : යොවි ටෙක් ට්‍රේඩිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 113005
ලියාපදිංචි කළ දිනය : 2016.04.08
ලියාපදිංචි කාර්යාලය : අංක 257, බටගම දකුණ, කඳාන.

යූ. වී. ඩී. එන්. එල්. කරුණාරත්න,
සමාගම් ලේකම්,
යොවි ටෙක් ට්‍රේඩිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්.

09-705

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කල බව දැනුම්දීම

හෝමාගම පිටිපන උතුර අංක 185 දරන ස්ථානයෙහි පදිංචි මඩපාතගේ සේනානායක ඇලෙක්සි වන මම කිරිවත්තුඩුව පිටිපන දකුණ ගලගාවහේන අංක 242/1 දරන ස්ථානයෙහි පදිංචි කත්‍රි අච්චිගේ කුමුදිනී ප්‍රේමලතා යන අයට එච්. එන්. එස්. හදුන්නෙත්ති නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කළ අංක 5044 සහ 2011.03.25 දිනැති ඇටෝර්නි බලපත්‍රය මගින් මා නමින් සහ මා වෙනුවෙන් දී තිබූ ඇටෝර්නි බලය 2017.09.05 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර එදිනට පසුව ඇය විසින් කරනු ලබන කිසිඳු ක්‍රියාවකට මා විසින් වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මඩපාතගේ සේනානායක ඇලෙක්සි.

09-721

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය ප්‍රකාරව පහත සමාගමේ නම පහත පරිදි වෙනස් කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැවති නම : ඇඩම්ස් පීක් ටී ඇන්ඩ් ට්‍රේඩර්ස් (පීවීටී) එල්ටීඩී
වෙනස්කල පසු නාමය : ඇඩම්ස් පීක් ගෘප් ඔෆ් කම්පැනීස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 83127
ලියාපදිංචි කාර්යාලය : අංක 06, කැම්ප්බෙල් ටෙරස්, කොළඹ 10.
ලියාපදිංචි දිනයඃ 2016.02.29

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

09-711

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ඇක්වා ලයිෆ් වෝටර්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 124050
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 53, දන්ගොල්ල වත්ත, මීගොල්ල, හින්දගොල්ල, කුරුණෑගල
ලියාපදිංචි දිනය : 2017.07.20

සමාගමේ නම : ග්‍රේට් වින් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 124044
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 254 1/2, කොළඹ පාර, කුරුණෑගල
ලියාපදිංචි දිනය : 2017.07.20

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු).

09-712

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : සී.ජේ.කේ. ඉලෙක්ට්‍රිකල් සොලූෂන් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 122414
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : තල්ගස්මුල්ල, තැඹිලි පොල, ඊතානවත්ත.
ලියාපදිංචි දිනය : 2017.05.19

සමාගමේ නම : එම් ඒ රිසෝර්ට්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකයඃ පී.බී. 122396
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 498/4, හයිලෙවල් පාර, පන්නිපිටිය.
ලියාපදිංචි දිනය : 2017.05.18

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

09-713

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගම් සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

(01) සමාගමේ නම : සන්ක්වික් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 122012
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 36, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.
සංස්ථාගත කළ දිනය : 2017.05.02

(02) සමාගමේ නම : සන්ක්වික් ලංකා ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 122045
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 36, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.
සංස්ථාගත කළ දිනය : 2017.05.03

ප්‍රියදර්ශනි ගුණසේන,
සමාගම් ලේකම්.

09-652

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ අංක 9 ඡේදය අනුව පහත සමාගම සංස්ථාගත කිරීමේ නිවේදනය සිදු කරමු.

සමාගමේ නාමය : ලයිෆ් ඇන්ඩ් ලක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 124833
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය :අංක18/2බී, ජෙසිමා මන්සිල්, කොටේගොඩ, හෙම්මාතගම
සංස්ථාගත කළ දිනය : 2017 අගෝස්තු මස 30 වැනි දින.

කේ. එම්. ශිහාන්,
සමාගමේ ලේකම්.

09-756

---

### නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : අමෙන්ෂා හවුසිං ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 125066
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 150/163, ගොල්ඩන් ග්‍රෝව්, කොස්පලවින්න, රත්නපුර
ලියාපදිංචි දිනය : 2007 අගෝස්තු මස 28 වැනි දින

කේ. එම්. ෂෙහාන්,
සමාගම් ලේකම්.

09-757

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

මඩකලපුව, කළුවාන්චිකුඩි - 9, මණල් වීදිය, කුරුකුලසිංගම් දයාලේස්වරන් යන පුද්ගලයාට එක්සත් රාජධානියේ HA2 9 TJ මිඩිල් සෙක්ස් හරෝ, රෙයිනර්ස් ලේන්, මක්මිලන් කෝඩ් - 23 මහේස්වරි දර්මරෙඩ්නම් මහත්මිය යන මා විසින් ලබා දෙන ලද, එක්සත් රාජධානියේ HA2 9RY. මිඩිල් සෙක්ස් හරෝ ඇලෙක්සැන්ඩර් මාවත 457බී රවි සොලිසිටර්, ශණ්මුහම් රවින්ද්‍රන් සොලිසිටර් ඉදිරිපිට දී 2014.09.12 වැනි දින අත්සන් කරන ලද මඩකලපුව නැගෙනහිර කළාප රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2014.10.01 වැනි දින 589 වන අනු අංකයේ 40 වැනි පිටුවේ 22 වැනි පොතේ සටහන් කරන ලද ඇටෝර්නි බලය මෙයින් අවලංගු කරන බව මෙයින් ශ්‍රී ලංකා රජය සහ මහ ජනතාවට ද දැනුම් දෙමි. මින් ඉදිරියට එම පුද්ගලයා විසින් කරනු ලබන කටයුතු, ක්‍රියාකරකම් කිසිවකටත් මා වග නොකියන බව ද මෙයින් ප්‍රකාශ කර සිටිමි.

මහේස්වරි දර්මරෙඩ්නම් මහත්මිය.

09-758

---

### ඇටර්නි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

පන්නිපිටිය, පැලැන්වත්ත, අංක 204/3 හි පදිංචි ඩී. ආර්. එම්. ආර්. එස්. බණ්ඩාර වන මා විසින් ජෙඩාහි ශ්‍රී ලංකා කොන්සියුලේට් ජනරාල් විසින් සහතික කරන ලදුව දසනායක රණසිංහ මුදියන්සේලාගේ චරිත් අසංක බණ්ඩර (ජා. හැ. අංක 843000037 වී) වෙත ප්‍රදානය කරන ලදුව, බත්තරමුල්ල, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි කොට්ඨාසයේ වෙළුමේ/පත්ඉරු 114/107/2777 හි 2014 අගෝස්තු මස 20 වැනි දින ලියාපදිංචි කරන ලද 2014 මාර්තු 6 දින දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

09-781

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර දැන්වීමයි.

සමාගම් නාමය : ෆෝටෝන් එනර්ජි පුද්ගලික සමාගම
සමාගමේ අංකය : පී එල් 125043
සංස්ථාගත කළ දිනය : 2017 අගෝස්තු මස 28 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : චායා, මඩකලපුව පාර, රෝහල හන්දිය, පොළොන්නරුව.

ලේකම්.

09-784

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

රෝමේල් විජේවර්ධන නොතාරිස් තැන විසින් වර්ෂ 2014ක් වූ ඔක්තෝබර් මස 15 වැනි දින ලියා සහතික කරන ලද අංක 17921 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් නුගේගොඩ, ගංගොඩවිල, පැපිලියාන පාර, අංක 94/7 දරන තැන පදිංචි ලුනුවිල හේවාගේ චන්ද්‍රිකා ස්වර්ණමාලා වන මා විසින් කෑගල්ල, කෙලින් වීදිය, අංක 271 දරන තැන පදිංචි කරඳන ආචාරිගේ සුදත් ප්‍රියන්ත වෙත පවරනු ලැබූ ඇටෝර්නි බලය මෙයින් අවලංගු කොට නිෂ්ප්‍රභා කරන බවත්, මෙහි සඳහන් දිනයට පසුව එළඹෙන දිනයක මා වෙනුවට ඉහත සඳහන් ඇටෝර්නි බලලාභි මෙම කරුණට අදළව කරන කිසිදු ක්‍රියාවක් වෙනුවෙන් වගකීමකට බැඳී නොසිටින බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, පොදු ජනතාවටත් මෙයින් දන්වා සිටිමු.

ලුනුවිල හේවාගේ චන්ද්‍රිකා ස්වර්ණමාලා.

09-799

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීමයි

ගනේමුල්ල, කැන්දලියද්දපාළුව, පරණ ගම්පහ පාර, අංක 247/1 දරන ස්ථානයෙහි පදිංචි දෙයාලගේ දෝන ඉන්දිකා දීපානි (ජා. හැ. අ. 768131546V) වන මා විසින් මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් අම්බලන්ගොඩ, රන්දෙඹේ, කැපූඇල පාර, අංක 16/8 දරන ස්ථානයෙහි පදිංචි මුකුන්දදුර දිමුතු සම්පත් පෙරේරා (ජාතික හැඳුනුම්පත් අංක 793264020 වී) යන අයව පත් කරමින් වර්ෂ 2015 අප්‍රේල් මස 27 වැනි දින ඊශ්‍රාලයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ පළමු ලේකම් වන එම්. ආර්. සී. බී. ඒකනායක යන අය ඉදිරියේ සහතික කරන ලද හා රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ ගාල්ල දකුණු කලාප කාර්යාලයේ ලිඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර පොතේ 58 වන කාණ්ඩයේ 70 වන පත්ඉරුවේ හා 794 දරන දිනපොත් අංකය යටතේ වර්ෂ 2015 මැයි 06 වැනි දින ලියාපදිංචි කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙතැන් සිට අවලංගු කොට බලරහිත කළ බවත්, මින් මතුවට එකී ඇටෝර්නි බලපත්‍රයේ කිසිදු නෛතික වලංගුතාවක් නැති බවත් ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

දෙයාලගේ දෝන ඉන්දිකා දීපානි.

2017 සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

09-803

---

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ෆ්ලයි මැටර්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 122596
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 88/1/ඒ, සාලාවත්ත පාර, වැල්ලම්පිටිය
ලියාපදිංචි දිනය : 2017.05.29

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

09-804

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

නම : විස්ඩම් කොමර්ෂල් හෝල්ඩිංස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 124873
සංස්ථාගත කළ දිනය : 2017 සැප්තැම්බර් 07 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 93/1,හෝටන් පෙදෙස, කොළඹ 07.

ලේකම්.

09-815

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 59(2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ ප්‍රාග්ධනය අවකරණය පිළිබඳව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : මොන්සූන් ඩියුන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 2743
සමාගමේ ලිපිනය : අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05

අවකරණයට පෙර ප්‍රාග්ධනය : රු. 89,821,400
අවකරණයට පසු ප්‍රාග්ධනය : රු. 71,400
අවකරණය කරන මුදල : රු. 89,750,000

සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 10, හැව්ලොක් පෙදෙස,
කොළඹ 05.

09-818/1

---

### නිවැරදි කිරීමේ දැන්වීමයි

ද නොන් - ස්පයිසි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 73207) සමාගමේ ප්‍රාග්ධනය අවකරණය කිරීම පිළිබඳ 2017 ජූලි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 1384 පිටුවේ පළ වූ අංක 07-479 දරන දැන්වීම පහත ආකාරයෙන් නිවැරදි විය යුතු වේ.

අවකරණයට පසු ප්‍රාග්ධනය : රු. 10,000,000
අවකරණය කරන මුදල : රු. 22,286,000

සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

09-818/2

---

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීම.

1. සමාගමේ නම : මෙල්ස්ටා ෆාමසියුටිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 124904
3. සමාගම ලියාපදිංචි කරන ලද දිනය : 2017.08.24
4. සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 110, නොරිස් කැනල් පාර, කොළඹ 10

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එන්. සී. ගුණවර්ධන,
සමාගම් ලේකම්.

09-828

---

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සම්බන්ධ ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නම : මරුත නිලම් (පුද්ගලික) සමාගම
සංස්ථාගත කළ දිනය : 2017.03.31
ලියාපදිංචි කළ අංකය : පී වී 121303
ලියාපදිංචි කළ කාර්යාල ලිපිනය : කොට්ඨාස අංක 06, වන්කාලයි, මන්නාරම.

චන්ද්‍රවදනි වාසවන්,
සමාගම් ලේකම්.

09-654

---

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් සංස්ථාපිත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

(1) සමාගමේ නම : නන්දන් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
(2) දිනය : 2017.05.04
(3) සමාගමේ ලියාපදිංචි අංකය : PV 122035
(4) ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 10-2/3, චාලිමන්ට් පාර, වැල්ලවත්ත, කොළඹ 06.

චන්ද්‍රවදනි වාසවන්,
සමාගම් ලේකම්.

09-655

---

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සම්බන්ධ ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නම : බ්ලූස් ඩිවලොප්මන්ට් ෆවුන්ඩේෂන්
සංස්ථාගත කළ දිනය : 2017.06.05
ලියාපදිංචි කළ අංකය : ජී ඒ 3343
ලියාපදිංචි කළ කාර්යාල ලිපිනය : අංක 40/1, නෙල්සන් පෙදෙස, කොළඹ 06.

චන්ද්‍රවදනි වාසවන්,
සමාගම් ලේකම්.

09-656

---

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නම : වන්නි චිල්ඩ්‍රන් කෙයා ෆවුන්ඩේසන්
සංස්ථාගත කළ දිනය : 2017.05.26
ලියාපදිංචි කළ අංකය : ජී ඒ 3339
ලියාපදිංචි කළ කාර්යාල ලිපිනය : අංක 28-7/1, රාමක්‍රිෂ්ණ පාර, කොළඹ 06.

චන්ද්‍රවදනි වාසවන්,
සමාගම් ලේකම්.

09-657

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : මිලියන්ස්පේස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : PV 124074
ලියාපදිංචි කාර්යාලය : 61, 3 වැනි මහල, ජනාධිපති මාවත, කොළඹ 0 1
සංස්ථාගත කළ දිනය : 2017.07.20

සමාගම් ලේකම්.

09-688

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 8(3) (ආ) වගන්තිය ප්‍රකාරව හබරණ ලේක් රිසෝට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස පැවති (පෞද්ගලික) සීමිත වගකීම් සමාගම 2015 ජුනි මස 29 වැනි දින සිට එලිෆාස් රිසෝට් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස නම වෙනස් කරන ලදී.

පූර්ව සමාගමේ නම : හබරණ ලේක් රිසෝට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නම : එලිෆාස් රිසෝට් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 88195
ලියාපදිංචි ලිපිනය : අවුඩන්ගාව, කිබිස්ස.

එස්. ඩී. එස්. එස්. සෙක්‍රටරීස් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්වරු.
077 2340581.

09-695

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ප්රිස්ටයින් ග්රීන් හොටල්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 111393
ලියාපදිංචි ලිපිනය : අංක 116, ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ, කොළඹ 14.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපර්රේට් ඩී සොලිෂියෝ (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

09-722

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : කූපි මෝබයිල් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 124928
දිනය : 2017.08.22
ලියාපදිංචි අංකය : අංක 116 බී, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07
සමාගමේ ලේකම් : සී මැතිව් සහ කො. (පුද්ගලික) සමාගම
එස්. ඊ. සී/(2) 2013/311

09-835

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : නෝවා ලෝවෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 125250
දිනය : 2017.09.04
ලියාපදිංචි අංකය : අංක 116 බී, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07
සමාගමේ ලේකම් : සී මැතිව් සහ කො. (පුද්ගලික) සමාගම
එස්. ඊ. සී/(2) 2013/311

09-836

---

### සමාගමක නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳ අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ කලින් නම : එන් ස්පෝර්ට්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 81750
සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 90, හෝර්ටන් පෙදෙස, කොළඹ 07
සමාගමේ අලුත් නම : ඩිජිමාර්කට් සොලුෂන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ නම වෙනස් වූ දිනය : 2017 අගෝස්තු මස 31 වැනි ද

ඩිජිමාර්කට් සොලුෂන්ස් (පීවීටී) එල්ටීඩී සමාගම සඳහා සහ වෙනුවෙන්

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

2017 සැප්තැම්බර් මස 15 වැනි දින.

09-855

---

### මහජන දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 8 වගන්තිය ප්‍රකාරව සවුත් ලංකා ඇකඩමි ෆෝ ටර්ෂරි එඩියුකේෂන් ඇන්ඩ් ලීඩර්ෂිප් (ගරන්ටි) ලිමිටඩ් (ඇපයෙන්) සීමාසහිත වගකීම් සමාගමෙහි නම කින්ග්ඩම් කොරිඩෝර් (ගරන්ටි) ලිමිටඩ් ලෙස 2017ක් වූ මැයි මස 29 වැනි දින වෙනස් කරන ලදී.

සමාගමේ නම : සවුත් ලංකා ඇකඩමි ෆෝ ටර්ෂරි එඩියුකේෂන් ඇන්ඩ් ලීඩර්ෂිප් (ගරන්ටි) ලිමිටඩ්
සමාගම් අංකය : ජී එල් 2188
ලියාපදිංචි ලිපිනය : ''මුතුහර මැඳුර'' උනිඳුවෙල, තෙලිජ්ජවිල, මාතර, ශ්‍රී ලංකා
සමාගමේ නව නම : කින්ග්ඩම් කොරිඩෝර් (ගරන්ටි) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී ඒ කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 011 2 802 462/071 8 244 495/077 8 197 041

09-859

---

### මහජන දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව ජනිත් ෆිෂරීස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2017 සැප්තැම්බර් මස 11 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ජනිත් ෆිෂරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 125417
ලියාපදිංචි ලිපිනය : අංක 599/ඒ, ෂාවියා මාවත, උතුරු උල්හිටියාව, වෙන්නප්පුව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී ඒ කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071 8 244 495/077 8 197 041

09-860

---

**මහජන දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව ටැංගො කැෆේ (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2017 සැප්තැම්බර් මස 11 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ටැංගො කැෆේ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 125423
ලියාපදිංචි ලිපිනය : ''සහන'' ඉසුරු මාවත, එළවැල්ල පාර, මාතර.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී ඒ කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 011 8 244 495/077 8 197 041

09-861

---

**මහජන දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව විෂන්කෝ හෝල්ඩිංස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2017 අගෝස්තු මස 29 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : විෂන්~~කෝ හෝල්ඩිංස් ලංකා (ප්‍රයිවට්~~) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 125132
ලියාපදිංචි ලිපිනය : 17, අබේසේකරගම පාර, බරවකුඹුක

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී ඒ කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 011 2 802 462/071 8 244 495/077 8 197 041

09-862

---

**මහජන දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව වී ඩී ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2017 අගෝස්තු මස 29 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : වී ඩී ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 125165
ලියාපදිංචි ලිපිනය : 81, බෝගහ හංදිය, කිරිවැව, සෙවනගල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී ඒ කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 011 2 802 462/071 8 244 495/077 8 197 041

09-863

---

**මහජන දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව සී ඇන්ඩ් එස් ගෘෘප් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2017 අගෝස්තු මස 29 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : සී ඇන්ඩ් එස් ගෘෘප් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 125154
ලියාපදිංචි ලිපිනය : අංක 184, ජනඋදානගම, මුරවැසිහේන, බරවකුඹුක.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී ඒ කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 011 2 802 462/071 8 244 495/077 8 197 041

09-864

---

**මහජන දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව බයර්,ස් කලෙක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2016 මැයි මස 15 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : බයර්ස් කලෙක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 122251
ලියාපදිංචි ලිපිනය : 137, මිලේනියම් සිටි, අතුරුගිරිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී ඒ කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 011 2 802 462/071 8 244 495/077 8 197 041

09-865

---

**ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දෙඩම්ගස්ලන්ද, දැලතුඩුවවත්ත, ලිහිණිවැහැර පදිංචි බස්තියන් ගමගේ ස්වර්ණවතී (ජාතික හැඳුනුම්පත් අංක 695641133 V) වන මම මාගේ ඇටර්නි බලකාරිය වශයෙන් කුරුණෑගල මීගමු පාර, අලුත් මල්කඩුවාව, ~~අංක 368/6, හෝල්මිස් විලා හි~~ පදිංචි චන්දිමා කුමුදුනී ගෝනමඩවත්ත (ජාතික හැඳුනුම්පත් අංකය 198081604361) යන අය පත්කරමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් සුලේඛා මධුෂානි ජයතිලක මෙනවිය විසින් ලියා සහතික කරන ලද අංක 26 සහ වර්ෂ 2016.07.30 වැනි දින සහ කුරුණෑගල අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ අනුක්‍රමික අංක 2851 සහ වර්ෂ 2016.08.05 වැනි දින ලියාපදිංචි කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලු දෙනාම මෙයින් දැනගනිත්වා. තවද, මින්මතුවට ඉහත කී ඇටර්නි බලපත්‍රය මත සිදුකරන කිසිදු ක්‍රියාවක් ම විසින් අනුමත නොකරන බව ද එකී ඇටර්නි බලපත්‍රය මත කරන ක්‍රියාවක් සම්බන්ධයෙන් මා වෙත වගකීමක් නොපැවරෙන බව ද දන්වා සිටිමි.

2017.09.13

09-866

---

**විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

කහව උඩුවරාගොඩ අංක 119 A දරන ස්ථානයේ පදිංචි මුතුවාහන්දි දිනේෂා සමන්මලී ද සිල්වා වන මා විසින් දෙඩන්දූව, පින්කන්ද ආරච්චිවත්ත, අංක 8 දරන ස්ථානයේ පදිංචි හික්කඩුව විතානගේ රසංග මධුසංක වෙත ප්‍රදානය කරන ලද ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ නොතාරිස්වරියක වන එම්. කේ. පිංතු මහත්මිය විසින් වර්ෂ 2017 ක් වූ මැයි මස 30 වැනි දින ලියා සහතික කරන ලද අංක 1830 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

මුතුවාහන්දි දිනේෂා සමන්මලී ද සිල්වා.

2017 ක් වූ අගෝස්තු මස 30 වැනි දින දී ය.

09-869

---

**ඇටෝර්නි බලය අවලංගු කිරීම**

සියළු දෙනාම මෙයින් දැනගත යුතු වග නම් බත්තරමුල්ල, තලංගම උතුර, හීනැටි කුඹුර පාර, අංක 55/09 දරන ස්ථානයේ පදිංචි සීක්කුගේ නිලූෂි සවන්තිකා සිල්වා වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවට හා පොදු ජනතාවට මෙයින් කියා සිටින්නේ කෙන්ගල්ල, බලගොල්ල, අංක 577 යන ලිපිනයෙහි පදිංචි නිහාල් ලක්ෂමන් ජයවර්ධන යන අයට බලය පවරමින් නුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. නියාගම යන අය විසින් ලියා සහතික කළ 2016.12.10 දිනැති අංක 6124 දරන ඇටෝර්නි බලකරය මෙතැන් සිට අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත්, මෙතැන් සිට ඒ හේතුවෙන් එම ඇටෝර්නි බලකරය ශූන්‍ය හා බලරහිත සහ නීතියෙන් බලාත්මක කල නොහැකි බවත් ය.

එස්. එන්. එස්. සිල්වා.

2017 ජුලි මස 29 වැනි දින,
කොළඹ දී ය.

09-882

---

**ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 59 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ ප්‍රාග්ධනය අවකරණය පිළිබඳව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : ෆීනික්ස් රීගල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 2619
සමාගමේ ලිපිනය : අංක 409, 3 වැනි මහල, ගාලු පාර, කොළඹ 03

අවකරණයට පෙර ප්‍රාග්ධනය : රු. 22,200,013
අවකරණයට පසු ප්‍රාග්ධනය : රු. 73,000
අවකරණය කරන මුදල රු. 22,127,013

සෙක්‍රටේරියල් හවුස් ඇඩ්වයිසරි (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 10, හැව්ලොක් පෙදෙස,
කොළඹ 05.

09-868

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ඩී එෆ් සී සී බැංකුව පී එල් සී**
**(කලින් ඩී එෆ් සී සී බැංකුව ලෙස හැඳින්වූ)**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 8618 සහ 8927 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර උතුරු තොටමුණේ, කළුතර බැද්දේ, කළුතර නගර සභා සීමාවට අයත්, කළුතර වෙලපුර පිහිටි, මහවත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු බී. කේ. පී. ඩබ්. ගුණවර්ධන විසින් සාදන ලද 1998 ඔක්තෝබර් මස 08 දිනැති අංක 816 දරන පිඹුරේ ලොට් අංක 1 සහ 3 ලෙස දැක්වෙන යාබදව එකළග පිහිටි (කලින් බලයලත් මිනින්දෝරු එල් එස් එන් ද සිල්වා විසින් සාදන ලද 1956 අගෝස්තු මස 05 වැනි දිනැති අංක 104 දරන පිඹුරේ දැක්වෙන ලද ඉඩම) බිම් කට්ටි දෙක.

ඉඩමේ ප්‍රමාණය: අක් - 00: රූඩ්:00 පර්:35.93
එහි පිහිටි පස, ගස්වැල්, වගාවන්, ගොඩනැගිලි සහ සියල්ල ඇතුළත්ව.

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් D.A. පුංචිහේවා විසින් සහතික කරන ලද, 2007 ජූලි මස 20 වැනි දිනැති අංක 8618 දරන සහ 2008 මැයි මස 15 වැනි දිනැති අංක 8927 දරන උකස්කරයන් ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ 1982 අංක 17 දරන සමාගම් පනත/ 1938 අංක 51 දරන ආඥා පනත යටතේ නීතිගත වූ ලියාපදිංචි අංක N(PVS) 36637 දරන සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 362, ගාලු පාර, කළුතර දකුණ පිහිටි සී/ස ඔනෙක් ෆයින් ප්‍රොපටීස් (පුද්ගලික) සමාගම විසින්

ඩී එෆ් සී සී බැංකුව පී එල් සී ට උකස් කරන ලදූ ව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී. එෆ්. සී. සී. බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2017 ඔක්තෝබර් මස 17 වැනි දින (අඟහරුවාදා පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙනදේසියේ විකණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවීය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10%ක් (සීයයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සීයයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සීයයට දෙකහමාර),
4. රු.99,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000.00
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.00

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමත්තන: දුරකථන අංක 011 -2371371.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය."

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 125 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

ප්‍රධාන කාර්යාලය :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

09-802

---

**ඩී එෆ් සී සී බැංකුව පී එල් සී**
**( ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී හි අනුප්‍රාප්තික)**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 607, 1728 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, කොළඹ මහ නගර සීමාවේ, වැල්ලවත්ත උතුර ග්‍රාම සේවා වසමේ, වැල්ලවත්ත උතුර කොට්ඨාස අංක 14 හි පිහිටි (කලින් කොටහේන කොට්ඨාසය), අංක 03-8/1, ෆ්‍රෙඩ්රිකා පාර යන ලිපිනය දරන, බලයලත් මිනින්දෝරු කේ. කනගසිංගම් විසින් සාදන ලද 2014 පෙබරවාරි 11 වැනි දිනැති අංක 3065 දරන සහාධිපත්‍ය පිඹුරේ නිවාස අංක EGA (8 වන මහල) ලෙස දැක්වෙන සහාධිපත්‍ය ඒකකය.

*ප්‍රමාණය* : වර්ග මීටර් එකසිය විසි පහයි දශම හතරයි දෙකක බිම් ප්‍රමාණය (125.42Sq.m.) එනම් වර්ග අඩි 1350 ක් සහ එහි පිහිටි සියල්ල සහිතව කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක Con SPE 17/124 යටතේ ලියාපදිංචි කර ඇත.

අංක EGA දරන සහාධිපත්‍ය ඒකකයෙහි සාලයක්/ කෑම කාමරයක්, ප්‍රධාන නිදන කාමරයක්, සමාන්‍ය නිදන කාමර 3ක්, පැන්ට්‍රි, වැසිකිළි 3ක් සහ සඳළුතල සහිත ය.

මෙම සහාධිපත්‍ය ඒකක අංක EGA හි සාමාන්‍ය තත්ව යටතේ නොබෙදූ වටිනාකම මුළු සහාධිපත්‍ය ඒකකයේ වටිනාකමින් 2.29% කි.

EGA හි පොදු භාවිත ප්‍රදේශයේ අසල්වැසි ඒකකය CE32 වේ.

සහාධිපත්‍ය දේපළවල පොදු අන්තර්ගතය :

1. සහාධිපත්‍ය දේපළ පිහිටා තිබෙන ඉඩම සහ ඒකකයට අදාළ අනු කොටසේ විවෘත අවකාශය,
2. පාදම, කණු, බාල්ක, උළුවහු, ආධාරක බිත්ති සහ ගොඩනැගිල්ලේ වහල,
3. ප්‍රධාන සේවා සැපයුම් වන විදුලිය, දුරකථන, රේඩියෝ, රූපවාහිනී සේවා, රූපවාහිනී නාලිකා සේවා, ජලනළ, වතුර ටැංකි, මලනළ ටැංකි, ඉහලින් පිහිටි වතුර ටැංකි, පොම්පාගාරය, අනෙකුත් නළ, මලාපවහන, මනුබිල, අපද්‍රව්‍ය ඉවත් කිරීම.
4. දේපළ භාවිතා කිරීමේ දී සාමාන්‍යයෙන් අවශ්‍ය වන සහ පහසුව සපයන, එහි පැවැත්මට ඇවැසි ඒකක, නඩත්තු සහ ආරක්ෂක අංග යනාදී සියලුම කොටස් සහ පහසුකම්.

ප්‍රසිද්ධ නොතාරිස් K. B. A. පෙරේරා විසින් සහතික කරන ලද, 2014 නොවැම්බර් මස 14 දිනැති අංක 1728 දරන සහ ප්‍රසිද්ධ නොතාරිස් D. I. N. තිලකරත්න විසින් සහතික කරන ලද 2016 සැප්තැම්බර් මස 02 දිනැති අංක 607 උකස්කරයන් ප්‍රකාර, කොළඹ 11, SIO ඉන්ටර්නැෂනල් රෙක්රූට්මන්ට් එජන්සි නම් ව්‍යාපාරය පවත්වාගෙන යන කොළඹ පදිංචි, අනෝමා පංචසාරම් නොහොත් කස්තුරිආරච්චි යන අය විසින් ඩී එෆ් සී සී බැංකුව පී එල් සී (ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී හි අනුප්‍රාප්තික) ට උකස් කරන ලදු ව, ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2017 ඔක්තෝබර් මස 19 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය* .- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10%ක් (සියයට දහයක්)
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර)
4. රු.87,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000.00
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.00

ගැනුම් මිලෙන් 90% ක් වු ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු අයබදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමඟ වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු ය.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමතන්න: දුරකථන අංක 011-2371371.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 125 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

ප්‍රධාන කාර්යාලය :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

09-801

HNB 256 - 17 (2)

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - පංචිකාවත්ත ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද, 2016 සැප්තැම්බර් මස 05 සහ 06 දිනයන් හි සහතික කළ අංක 5401 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම රාමයියා නාරායනසාමි ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2017 ක් වූ ඔක්තෝබර් මස 19 වැනි දින පෙ.ව. 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉහත සඳහන් කළ උපලේඛනය වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු මෙල් අක්කරෙයිපත්තු කල්පිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ පල්ලිවාසල් පදු 598බී ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, දකුණු අක්කරෙපත්තුවේ, කන්දතොඩුව සහ පලුවාසල් හි පිහිටි පල්ලිවාසල් කාඩු නොහොත් පල්ලිවාසල් පාදු නමැති ඉඩම ප්‍රමාණයෙන් අක්කර හතරයි, රූඩ් දෙකයි, පර්චස් අටක් (අ:4 - රූ2 - පර්: 8) විශාලත්වයෙන් වූ ඉඩම සමග එහි ඇති සියලු දේත් සමග වේ.

ඉහත සඳහන් ඉඩම මැතක දී සාදන ලද පිඹුරක් ප්‍රකාරව මෙසේ විස්තර කෙරේ.

ඉහත සඳහන් දකුණු අක්කරෙපත්තුවේ කන්දතොඩුව සහ පලුවාසල් ගමෙහි පිහිටි පල්ලිවාසල් කාඩු නොහොත් පල්ලිවාසල් පාදු නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. නඩේසන් විසින් 2016 මැයි මස 03 වැනි දින පිළියෙල කරන ලද අංක 191 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර හතරයි රූඩ් දෙකයි පර්චස් අටක් (අ:4 - රූ2 - පර්: 8) විශාලත්වයෙන් වූ ඉඩම සමග එහි ඇති සියලු දේත් සමග වේ. බලයලත් මිනින්දෝරු ආර්. නඩේසන් විසින් 2016 මැයි මස 03 වැනි දින පිළියෙල කරන ලද අංක 191 දරන පිඹුරේ දක්වා ඇති අඩි 12 ක අඩි පාරක් සඳහා වෙන් කරන ලද මාර්ගය ද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2017.08.11 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2017.08.31 දින ලක්බිම, තිනක්කුරල් සහ ඩේලි මිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.*- කොළඹ සිට කොළඹ - පුත්තලම් මාර්ගයේ කි.මී. 113 ක් පමණ මදුරන්කුලිය නගරය දක්වා ගමන් කරන්න. කි. මී. 113 කණුව පසු කරනවාත් සමගම වමට ඇති මුක්කතොඩුවාව පාරට වමට හැරී කි.මී. 7 1/2 ක් පමණ ගොස් මුක්කතොඩුවාව පිළිමය ළඟින් වමට හැරෙන්න. කි. මී. 4.3 පමණ ගොස් ගෝට්ටිය දැලේ කොන්ක්‍රීට් අතුරා ඇති ප්‍රාදේශීය සභා පාරට වමට හැරෙන්න. මීටර 200 ක් පමණ ගමන් කර දේවස්ථානය ඇති මංසන්දියෙන් ගුරු පාර දිගේ මීටර් 200 ක් පමණ තව දුරටත් ඉදිරියට ගොස් එම ගුරු පාරේ අවසානයේ ඇති විෂය වස්තුවට ළඟා විය හැකිය.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු. 500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු:

(ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා බලයලත්
වෙන්දේසිකරු.

අංක 156 - 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක - 0777-378441/ 0714-424478
0112-337707
ෆැක්ස් - 0112-509442

09-834

---

HNB 256 - 17 (1)

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - පංචිකාවත්ත ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2016 සැප්තැම්බර් 05 සහ 06 දිනයන් හි සහතික කළ අංක 5401 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම රාමයියා නාරායනසාමි ණය කරු ලෙස පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2017 ක් වූ ඔක්තෝබර් මස 19 වැනි දින පෙ.ව 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉහත සඳහන් කළ උපලේඛනය.*- වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු මෙල් අක්කරෙයිපත්තු කල්පිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහ පල්ලිවාසල් පදු 598බී ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, දකුණු අක්කරෙපත්තුවේ, කන්දතොඩුව ගමේ සහ පලුවාසල් හි පිහිටි පල්ලිවාසල් පදු නමැති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර නවයයි රූඩ් දෙකයි පර්චස් විස්සක් (අ. 9, රූ.2, පර්.20) විශාලත්වයෙන් වූ ඉඩම සමග එහි ඇති සියලු දේත් සමග වේ.

ඉහත සඳහන් ඉඩම මැතක දී සාදන ලද පිඹුරක් ප්‍රකාරව මෙසේ විස්තර කෙරේ.

ඉහත කී කන්දතොඩුව ගමේ සහ පලුවාසල් හි පිහිටි පල්ලිවාසල් පදු නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. සංකරලිංගම් විසින් 1996 ජනවාරි 14 වැනි දින පිළියෙල කරන ලද අංක 2034 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර දහයයි පර්චස් තිහක (අ:10, රූ:0, පර්: 30) විශාලත්වයෙන් වූ ඉඩම සමග එහි ඇති සියලු දේත් වේ.

ඉහත සඳහන් ඉඩම වඩාත් මැතක දී සාදන ලද පිඹුරක් ප්‍රකාරව මෙසේ විස්තර කෙරේ.

ඉහත කී කන්දතොඩුව ගමේ සහ පලිවාසල් හි පිහිටි පලිවාසල්පදු නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. සංකරලිංගම් විසින් 1999 ඔක්තෝබර් 11 වැනි දින පිළියෙල කරන ලද අංක 3481 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 සහ 2 වශයෙන් දැක්වෙන කොටස ප්‍රමාණයෙන් අක්කර දහයයි පර්චස් තිහක් (අ.10, රූ. 0 පර්. 30) විශාලත්වයෙන් වූ ඉඩම සමග එහි ඇති සියලු දේත් වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2017-08-11 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2017-08-31 දින ලක්බිම, තිනක්කුරල් සහ ඩේලි මිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.*- කොළඹ සිට කොළඹ - පුත්තලම් මාර්ගයේ කි.මී. 113 ක් පමණ මදුරන්කුලිය නගරය දක්වා ගමන් කරන්න. කි.මී. 113 කණුව පසු කරනවාත් සමගම වමට ඇති මුක්ක තොඩුවාව පාරට වමට හැරී කි. මී. 7 1/2 ක් පමණ ගොස් මුක්කතොඩුවාව පිළිමය ළඟින් වමට හැරෙන්න. කි. මී. 4.3 පමණ ගොස් ගෝට්ටිය දැලේ කොන්ක්‍රීට් අතුරා ඇති ප්‍රාදේශීය සභා පාරට වමට හැරෙන්න. මීටර 200 ක් පමණ ගමන් කර දේවස්ථානය ඇති මංසන්දියෙන් ගුරු පාර දිගේ මීටර 200 ක් පමණ තව දුරටත් ඉදිරියට ගොස් එම ගුරු පාරේ අවසානයේ ඇති විෂය වස්තුවට ළඟා විය හැකිය.

*ගෙවීමේ ක්‍රමය.* -වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු. 500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු:

(ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

අංක. 156 - 1/13,
උසාවිය පාර, කොළඹ 12.
දුරකථන අංක - 0777-378441/0714-424478
0112-337707
ෆැක්ස් - 0112-509442

09-832

---

HNB 255 - 17

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මරදගහමුල ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනුලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී නමට ලියන ලද්දා වූ ද 2014 සැප්තැම්බර් 18 වැනි දින සහතික කළ අංක 4744 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම ක්‍රිස්ටෝපර් ප්‍රේමලාල් සුමිත් ජයලත් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අය කර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2017 ක් වූ ඔක්තෝබර් මස 17 වැනි දින ප.ව. 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉහත සඳහන් කළ උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, රාගම 181 දරන ග්‍රාම නිලධාරි වසමේ, අළුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ, රාගම ඒකකයේ ජා ඇල ප්‍රාදේශීය සභා සීමාව තුල රාගම හි පිහිටි දෙල්ගහ වත්ත, සියඹලාගහවත්ත සහ කහ කොටුව නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වඩ් විසින් 2004 ජනවාරි 24 වැනි දින පිළියෙල කරන ලද අංක 2699එෆ් දරන පිඹුරෙන් බෙදාවෙන් කරන ලද ලොට් 2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස, පර්චස් දාහතක (අ:0. රූ0. පර්: 17) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලුමදේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2017.07.14 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2017-08-04 දින ලක්බිම, තිනක්කුරල් සහ ඩේලිමිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.*- කඳාන නගර මධ්‍යයේ සිට ගනේමුල්ල පාරේ (බස් මාර්ග 276) මුරුන්ගස් හන්දිය දක්වා ගමන් කොට රථ වාහන යා හැකි තාර දමා ඇති ''බෝයිස් ටවුන්'' නමැති පාරට (ජයසිරිගම පාර) දකුණට හැරී, මීටර් 300 ක් පමණ ගොස් පොල්හේන නමැති රථ වාහන යා හැකි තාර දමා ඇති පාරට දකුණට හැරී මීටර 800ක් ගොස් තාර දමා ඇති රථ වාහන යා හැකි පාරට දකුණට හැරී අවසන් වශයෙන් තාර දමා ඇති රථ වාහන යා හැකි පාරට දකුණට හැරී මීටර් 100ක් පමණ ගමන් කර අදාල දේපළට ළඟා විය හැකිය. එය එම පාරේ දකුණු අත පැත්තේ පාරට ඉදිරිපසක් සහිතව පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු. 500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නො ගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සි. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

අංක. 156 - 1/13,
උසාවිය පාර, කොළඹ 12.
දුරකථන අංක - 0777-378441/071-4424478
0112-509442
ෆැක්ස් - 0112-509442.

09-833

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දක්වෙන දිනයේදී එකී දේපළ පිහිටි ස්ථානයේදී එහි දක්වා ඇති වේලාවේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර තුල, මාතර මහ නගර සභා බලසීමාවේ, කොටුවෙගොඩ හි ගුණවර්ධන මාවතේ, වරිපනම් අංක. 43 සහ 43/1 දරන බලයලත් මානක පී. දහනායක විසින් සකසන ලද වර්ෂ 2002/12/02 දිනැති අංක. 1907 බී දරන පිඹුරේ, නිරූපිත පල්ලියගෙවත්තෙහි ලොට් බී හි ලොට් 1 සහ පල්ලියගෙවත්තෙහි ලොට් සී ලෙස හඳුන්වනු ලබන ඒකාබද්ධ කරන ලද ඉඩම් වල ලොට් 1 දරන ඉඩම් කොටස් වේ. මෙම ඉඩම මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඒ 464/194 හි ලියාපදිංචි කර ඇත.

(බිම් ප්‍රමාණය : අ. 0, රූ.0, ප.14.93)
වර්ෂ 2017 ක්වූ ඔක්තෝබර් මස 16 වැනි දින පෙ.ව. 11.00 ට

*දේපළට පිවිසෙන මාර්ගය.*- මාතර බස් නැවතුම්පලේ සිට තංගල්ල පාර දිගේ මීටර් 200 ක් පමණ ගමන් කළ විට දේපලට ළඟා විය හැක. එය පාරේ වම් අත පැත්තට වන්නට පිහිටා ඇති අතර ගුණවර්ධන මාවතේ, වරිපනම් අංක. 35 සහ 37 න් යුක්තය.

කොග්ගල හේවා පත්තිනිගේ දමිත කුමාර ''බන්ධනදායී/ උකස්කරු'' වශයෙන් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් පී. ජී. සී. නානායක්කාර විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2015/03/12 දිනැති අංක. 15073 සහ වර්ෂ 2011/07/13 දිනැති අංක. 12217 දරන අතිරේක චල උකස් බැඳුම්කරයන්, සහ වර්ෂ 2009/04/24 දිනැති අංක. 10523, වර්ෂ 2008/09/30 දිනැති අංක. 10272 සහ වර්ෂ 2005/04/26 දිනැති අංක. 7460 දරන අතිරේක ප්‍රාථමික චල උකස් බැඳුම්කරයන් සහ වර්ෂ 2004/10/09 දිනැති අංක. 7153 දරන අතිරේක ප්‍රාථමික චල උකස් බැඳුම්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2017/09/08 වැනි දින දි අයිලන්ඩ්, ලක්බිම, තිනක්කුරල් පුවත් පත් සහ එදින ගැසට් පතද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(1) ගැනුම් මුදලේ 10% ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
(4) ප්‍රචාරක වියදම් ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
(6) ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90%ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10%ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු කළමණාකරු - ණය අයකර ගැනීම් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී, ප්‍රධාන කාර්යාලය, අංක. 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන - 011-4667230

තුසිත් කරුණාරත්න,
උසාවි කොමසාරිස් සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3(50/3), විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන අංක : 011-3068185 ෆැක්ස්: 011-2572940.

09-857

---

**I කොටස : I ඡේදය යටතේ පළවන දැන්වීම් සහ I කොටස : (IIආ) ඡේදයේ වෙන්දේසි කිරීම් යටතේ පළවන ඉතිරි සියලු දැන්වීම් 2017.09.29 දින ගැසට් පත්‍රයේ පළවේ.**

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk